ආඛ්‍යාන narrations
**Volume 02 | Issue 02 | July – December 2017 | Article 03**
**ISBN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

CC BY NC ND

---

# දන්තුරේ සටන් ව්‍යාපාරය ඔස්සේ විද්‍යමානවන ශ්‍රී ලාංකේය පාරම්පරික යුද ඥානය මූලධර්මගත කිරීම

තුෂාර විතාරණ[3]

B.A (Hons), M.A, M Phil (Reading)

## සංක්ෂිප්තය

ක්‍රි.ව 1505 දී ශ්‍රී ලංකාවට ගොඩබට පෘතුගීසීහු එවක ශ්‍රී ලංකාවේ අගනුවර වූ කෝට්ටේ සමග සම්බන්ධතා ගොඩනගා ගත්හ. ක්‍රි.ව 1521 දී කෝට්ටේ රාජ්‍යයේ සිදු වූ විජයබා කොල්ලය හේතුවෙන් එතෙක් ශ්‍රී ලංකා දේශපාලනයේ පරිධියෙහි සිටි පෘතුගීසීහු කේන්ද්‍රීය චලනයන් හා සම්බන්ධ විය. උපක්‍රමික දේශපාලන අවශ්‍යතාවයක් මත පෘතුගීසීන් විසින් කන්ද උඩරට රාජ්‍යය අත්පත් කරගත්ත ද, පෘතුගීසීන්ට එරෙහි ව යමින් 1 වැනි විමලධර්මසූරිය රජු විසින් එය ස්වාධීනත්වයට පත්කර ගැනීම පෘතුගීසීන් විෂයෙහි වෛරයක් ජනිත කිරීමට සමත් වූ කාරණයක් විය. එකී වෛර පිරිමසනු වස් කපිතන් ජෙනරාල් පේරූ ලෝපේස් ද සූසාගේ නායකත්වයෙන් යුතු ව කන්ද උඩරට ආක්‍රමණයට පැමිණි පෘතුගීසි හමුදාවට ඍජු ව මුහුණ නොදුන් විමලධර්මසූරිය රජුගේ කන්ද උඩරට හමුදාව දන්තුරේ දී විශ්මය සහිත ප්‍රහාරයක් එල්ල කරමින් පෘතුගීසීන් පරාජය කරන ලදි. ඒ වූ කලි දන්තුරේ සටන යැයි ප්‍රකට කන්ද උඩරට රාජාවලියේ සුජාතභාවය ස්ථාපිත කළ ඓතිහාසික සටනයි.

එකී දන්තුරේ සටන් ව්‍යාපාරය වත්මන් යුද සංකල්පයක් වන යුද මූලධර්ම (Principles of War) භාවිතයෙන් විශ්ලේශනය කිරීමත්, ඒ ඔස්සේ නිරාවරණය වන දේශීය යුද ඉතිහාසයේ ගැබ් ව ඇති ශ්‍රී ලාංකේය අනන්‍යතාවයක් සහිත යුද මූලධර්මයන් හඳුනා ගැනීමත්, මෙම අධ්‍යයනයෙන් සිදු කරනු ලබයි.

**ප්‍රමුඛ පද :** කන්ද උඩරට රාජධානිය, පෘතුගීසීන්, දන්තුරේ සටන් ව්‍යාපාරය, යුද මූලධර්ම.

---

[3]කථිකාචාර්ය, දියතලාව ශ්‍රී ලංකා යුද හමුදා විද්‍යාපීඨය.

## දන්තුරේ සටන් ව්‍යාපාරයේ පසුබිම.

ක්‍රි.ව 1497 ජූලි මස 8 වැනි දින වේගස් ගඟ මුවදොර පිහිටි බෙලම් වරායෙන් සයුරට ප්‍රවිශ්ඨ ව ක්‍රි.ව 1498 මැයි මාසයේ දී ඉන්දියාවේ කැලිකට් වරායට ගොඩබට වස්කෝ ද ගාමාගේ නායකත්වයෙන් යුත් ගේබ්‍රියල් නෞකාව යනු ආසියාවට පිවිසීමේ බටහිර සිහිනය සැබෑවක් කළ ප්‍රථම නාවික කණ්ඩායමේ ආසියානු ප්‍රවේශය විය (Scammell, 1989: 13). මුස්ලිම්වරුන්ගේ වෙළඳ ඒකාධිකාරය බිඳ දමනු වස් මුස්ලිම් නෞකාවන්ට බාධා කිරීමට ඉන්දියන් සයුරට පිවිසි ලෝරන්සෝ ද අල්මේදා ප්‍රමුඛ නාවුක කණ්ඩායමක් අනපේක්ෂිත ලෙස ගසාගෙන අවුත් ශ්‍රී ලංකාවේ කොළොම්තොටට ගොඩබසින ලදි. (පවෙල්, 2009: 21). එවක ශ්‍රී ලංකාවේ බලඅධිකාරිය වූ කෝට්ටේ රාජ්‍යය සමග සබඳතා ගොඩනගා ගත් පෘතුගීසින් වෙරළබඩ වෙළඳ කටයුතු හා සම්බන්ධ වූව ද ශ්‍රී ලංකාව යටත් කරගැනීමේ යටි අරමුණක් ඔවුන් වෙත පැවති බැව් පෘතුගාලයේ හැසිරීමෙන් පැහැදිලි වෙයි (බණ්ඩාරගේ, 2015). ක්‍රි.ව 1521 සිදු වූ විජයබා කොල්ලයත් සමග රාජධානි ත්‍රිත්වයකට බෙදී ගියේ ය (*රාජාවලිය*, 1976: 226). ඒ සමග කෝට්ටේ රාජධානියේ රජු බවට පත් වූ හත්වැනි බුවනෙකබාහු රජුට තම රාජ්‍යයේ ආරක්ෂාව පතා පෘතුගීසී සහය ලබා ගැනීමට සිදුවිය. එපමණක් ද නොව තමන්ගේ අනුප්‍රාප්තිකයා ලෙස නම් කළ ධර්මපාල කුමරුගේ ආරක්ෂාව පතා ඔහු පෘතුගීසීන් භාරයේ තැබීමට ද රජුට සිදුවිය (Muththukumaru, 1987: 61).මේ සමගින් පෘතුගීසීන්ට ශ්‍රී ලංකාවේ දේශපාලනයේ අනාගත උරුමකරු හිමිවීමත් සමග ඔවුන් ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ ප්‍රධාන භූමිකාවක් නිරූපණය කරන තත්වයක පත්වේ. සමකාලීන ව ශ්‍රී ලංකාවේ බල කේන්ද්‍රය විතැන් කිරීමට සමත් වූ සීතාවක රාජ්‍යයේ රජු වූ මායාදුන්නේ රජු රයිගම රාජ්‍යය ද තමන්ට නතු කරගනිමින් බලවත් වූ අතර කෝට්ටේ රාජ්‍යයට හා පෘතුගීසීන්ට එය මහත් අභියෝගයක් විය.

පසු කාලීන ව මායාදුන්නේ රජුගේ අනුප්‍රාප්තිකයා වූ සීතාවක 1 වැනි රාජසිංහ රජු[4] තම පාලන කාලය තුළ ත්‍රිවිධාකාර පාර්ශ්වයන් සමග සටනට පිවිස සිටියේ ය. සීතාවක රාජධානිය ශ්‍රී ලංකාවේ බලආධිපත්‍යය කර ගැනීම වස් එවකට අගනුවර වශයෙන් සලකන ලද කෝට්ටේ රාජධානිය සමග එක් අතෙකින් ද (*The Temporal and Spiritual Conquest of Ceylon*, 1930: 416), ඒ වන විටත් ශ්‍රී ලංකාවට පැමිණ සිටි පෘතුගීසීන් සමග අනෙක් අතින් ද, ප්‍රාදේශීය පාලන ඒකකයක් වූ කන්ද උඩරට සමග තවත් අතෙකින් ද, ඔහු බල අරගලයක නිරත විය (කොඩ්රිංටන්, 1998: 94-97). මොහුගේ බලපරාක්‍රමයෙහි හිනිපෙත්ත යැයි සැලකිය හැකි ක්‍රි.ව 1580-1590 යුගයේ දී කන්ද උඩරට රාජධානිය ආක්‍රමණය කර එය තමන් යටතට පත් කරගැනීමත් (ජයතිලක, 2013: 81), කොළඹ කේන්ද්‍ර කරගනිමින් පරිපාලනය වූ පෘතුගීසී බලකොටුවට දිගින් දිගට ම පහරදීමත් (අබේසිංහ, 2006: 16), සිදුවිය.

ක්‍රි.ව 1582 දී පමණ 1 වැනි රාජසිංහ රජු විසින් කන්ද උඩරට ආක්‍රමණය කිරීමේ දී එහි ප්‍රාදේශීය පාලකයා වූ කරල්ලියද්දේ බණ්ඩාර පළාගිය අතර ඔහුගේ මුණුපුරෙකු වූ යමසිංහ බණ්ඩාර සහ දියණිය වූ කුසුමාසන දේවිය මන්නාරමේ පෘතුගීසී ආරක්ෂාව යටතට පත් කරන ලදි (*The Temporal and Spiritual Conquest of Ceylon*, 1930: 438-439). හේඩර්ගේ තුලන න්‍යායෙහි විග්‍රහ

[4]සීතාවක 1 වැනි රාජසිංහ රජුගේ රාජ්‍ය කාලය වශයෙන් සැලකෙන්නේ ක්‍රි.ව 1581-1593 කාලය යි.

කරන ආකාරයට ''සතුරාගේ සතුරා මාගේ මිතුරාය'' යන්න (Khaífiah & Situngkir, n.d : 1) සනාථ කරමින් මේ වන විටත් රාජසිංහ රජුගෙන් පහරකමින් සිටි පෘතුගීසීන් සහ කන්ද උඩරට යන දෙපාර්ශ්වය අතර පැහැදිලි මිතුරු බවක් තිබූ බව එයින් පැහැදිලි වේ. දිගින් දිගට ම සීතාවක රාජ්‍යයෙන් එල්ල වන ප්‍රහාරයන්ගෙන් වැළකීම සඳහා 1 වැනි රාජසිංහ රජුගේ අවධානය වෙනතකට යොමු කිරීමේ අරමුණින් පෘතුගීසීන් විසින් කන්ද උඩරට රාජ්‍යය ස්වාධීනත්වයට පත් කිරීමේ උපක්‍රමයක් දියත් කළහ. මේ වන විටත් ඔවුන් සතු ව සිටි දොන් පිලිප් නමින් බෞතීස්ම ලැබූ යහසිංහ බණ්ඩාර කන්ද උඩරට සිංහාසනාරූඪ කිරීම එම උපක්‍රමයයි (සෝමතිලක, 2009: 15).

මේ සඳහා පෘතුගීසීන් විසින් උපයෝගී කරගන්නා ලද්දේ සීතාවක ප්‍රහාරයන් හී දී ද තමන්ට සහයෝගය දැක්වූ ඕස්ට්‍රියාවේ දොන් ජෝන් නමින් බෞතීස්ම ලැබ සිටි කොනප්පු බණ්ඩාර ය. ඔහු 1 වැනි රාජසිංහ රජු විසින් ඝාතනය කළ වීරසුන්දර බණ්ඩාරගේ පුත්‍රයා විය (කොඩ්රිංටන්, 1998: 97). මන්නාරමේ සිට දොන් පිලිප් පෙරටු කරගෙන දොන් ජෝන්ගේ ආරක්ෂාව යටතේ පැමිණි පෘතුගීසී හමුදාවන් රාජසිංහගේ හමුදාවන් පරාජය කරමින් කන්ද උඩරටට සේන්දු වූ අතර කන්ද උඩරට නව රජු වශයෙන් යහසිංහ බණ්ඩාර තම රාජ්‍ය උරුමය අත්පත් කරගත්තේ ය (අබේසිංහ, 2006: 17).

මෙලෙස කන්ද උඩරට රාජ්‍යය ස්වාධීනත්වයට පත්වුව ද කෙටි කලෙකින් යමසිංහ බණ්ඩාර මරණයට පත්විය (කොඩ්රිංටන්, 1998: 97). එහි ප්‍රතිඵලය වූයේ පෘතුගීසීන් විසින් අනුප්‍රාප්තිකයා වශයෙන් නම් කරන ලද යමසිංහ බණ්ඩාරගේ පුත්‍රයාට සහ පෘතුගීසී හමුදාවන්ට විරුද්ධ ව කොනප්පු බණ්ඩාර නැගී සිටිමින් කන්ද උඩරට සිහසුන තමන් යටතට ගැනීම යි. ඉන්පසු ක්‍රි.ව 1592 දී කොනප්පු බණ්ඩාර 1වැනි විමලධර්මසූරිය නමින් කන්ද උඩරට රජු වශයෙන් ප්‍රකාශයට පත්කරන ලදි (ජයතිලක, 2013: 83). තම අලුත් සතුරා සමග ක්‍රි.ව 1593 දී සටනට පිවිසි සීතාවක 1වැනි රාජසිංහ රජු සටනින් පරාජය වී පසුබසින අවස්ථාවේ දී උණ පතුරක් ඇණීමෙන් විෂ වී මියගියේ ය (කොඩ්රිංටන්, 1998: 97).

මේ අනුව කන්ද උඩරට 1වැනි විමලධර්මසූරිය රජු රජවීමෙන් පසු පෘතුගීසීන්ට තමන්ගේ අණසක යටතේ පැවති කන්ද උඩරට අහිමි වූවා සේම 1වැනි රාජසිංහ වැනි යුදකාමියෙකු පවා පරාජය කිරීමට තරම් ශක්තිමත් වූ බැවින් එය පෘතුගීසීන් අභියස දැවැන්ත අභියෝගයක් ද නිර්මාණය කරතිබූ බව පෙනේ. මේ වන විටත් කෝට්ටේ රාජධානිය දොන් ජුවාන් ධර්මපාල යොදා ගනිමින් තම අවශ්‍යතාවය අනුව පාලනය කිරීමට සමත් වූ පෘතුගීසීන්ට (කොඩ්රිංටන්, 1998: 99) 1වැනි රාජසිංහ රජු මියයෑමත් සමග සීතාවක රාජ්‍යයෙන් තිබූ බලපෑම ද අවසන් වූ බැවින් පෘතුගීසීන් කෙරෙහි පැවති එකම අභියෝගය වූයේ ද කන්ද උඩරට බිහි වූ නව රාජ්‍යය යි. සිංහල බෞද්ධයෙකු යටතේ පැවති බැවින් කන්ද උඩරට නව රාජ්‍යය ශ්‍රී ලංකාවේ බලකේන්ද්‍රය වශයෙන් ශ්‍රී ලාංකිකයන්ගේ පිළිගැනීමට ලක්වීම ද මෙහි දී පෘතුගීසීන්ට ඇති වූ තවත් බලපෑමක් විය.

පෘතුගීසීන්ගෙන් කන්ද උඩරට උදුරාගත් 1වැනි විමලධර්මසූරිය රජු එතෙකින් ද නොනැවතී දුමින්ගු කොරයා නොහොත් එදිරිල්ලේ රාළ යොදවා සීතාවක සහ කෝට්ටේ රාජ්‍යයන් නිදහස් කරගැනීමට ද කටයුතු කරන ලදි (අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2016: 87). මෙයින් පැහැදිලි වන්නේ පෘතුගීසීන්ගෙන් කන්ද උඩරට උදුරාගැනීමෙන් පසු ව 1වැනි විමලධර්මසූරිය පෘතුගීසීන්

විසින් එතෙක් අත්පත්කරගෙන සිටි ප්‍රදේශයන් ද තමන් යටතට ගැනීමේ ප්‍රයත්නයක යෙදුණු බවයි. *මන්දාරම්පුර පුවතේ* දක්වන ආකාරයට විමලධර්මසූරිය රජු තම අවධානය යොමු කළ තවත් අංශයක් විය. එනම් රාජසිංහ රජු විසින් හින්දු දහම වැළඳගෙන සිටි බැවින් බලවත් වෙමින් සිටි සිවකඳවුරු වලට ද විමලධර්මසූරිය රජු අභියෝග කළේය (*මන්දාරම් පුර පුවත*, 1998: 114). කෙසේ වුව ද දන්තුරේ සටනෙහි ආරම්භක අවස්ථාව වන විට පෘතුගීසීන් කෙරෙහි තිබූ දැවැන්ත ම අභියෝගය වූයේ කන්ද උඩරට නව රාජ්‍යය සහ එහි පාලකයා වූ 1වැනි විමලධර්මසූරිය රජු බව පැහැදිලි ය.

## දන්තුරේ සටන් ව්‍යාපාරය හැඳින්වීම.

ක්‍රි.ව 1580 දී කෝට්ටේ ධර්මපාල රජු විසින් පෘතුගීසීන්ට තෑගි ඔප්පුවක් මාර්ගයෙන් ශ්‍රී ලංකාව පවරා දීමත් (අබේසිංහ, 2006: 18), කන්ද උඩරට රාජ්‍යයේ නිල උරුමක්කාරිය වන දෝන කතරිනා නමින් බෞතීස්ම වූ කුසුමාසන දේවිය තමන් භාරයේ සිටීමත්, හේතුවෙන් පෘතුගීසීන්ට ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් නීත්‍යානුකූල අයිතියක් ඇතැයි ඔවුහු තර්ක කළහ. නමුත් ක්‍රි.ව 1592 සිට පෘතුගීසීන්ට පිටුපා කන්ද උඩරට රාජධානිය අත්පත් කරගෙන සිටි 1වැනි විමලධර්මසූරිය රජු ජනතා සහයෝගය ඇති ව පෘතුගීසීන්ට අභියෝග කරමින් පාලනය ගෙන ගියේය. මේ හේතුවෙන් තමන්ට නීත්‍යානුකූල ව හිමියැයි සිතූ කන්ද උඩරට රාජ්‍යය අත්පත් කරගැනීමට පෘතුගීසීන් විසින් මෙහෙය වන ලද ප්‍රථම ආක්‍රමණය ක්‍රි.ව 1593 දී සිදුවිය.

මෙම ආක්‍රමණය මෙහෙයවනු වස් පෘතුගීසී පාර්ශ්වයෙහි නායකත්වය සපයන ලද්දේ කපිතන් ජෙනරාල් පේරූ ලෝපේස් ද සූසා නම් නිලධාරිවරයා ය (Sri Lanka Military Academy, 2015: 12). ඔහු හඳුන්වන ලද්දේ ''විජයග්‍රහණයේ කපිතන් ජෙනරල් තැන'' යනුවෙනි (කොඩ්රිංටන්, 1998: 98). ගෝව සිට ශ්‍රී ලංකාවට පිටත් ව පැමිණි ඔහුගේ සැඟවුණු පුද්ගලික අරමුණ වූයේ කන්ද උඩරට රාජ්‍යය අත්පත්කරගෙන කුසුමාසන දේවිය තම බෑණාකෙනෙකුන්ට විවාහකර දී රාජ්‍යත්වය අත්පත් කරගනිමින් පෘතුගීසීන්ට පක්ෂපාතී ව රාජ්‍යය පාලනය කිරීම යි (*රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය*, 2002: 80-82). අවි ආයුධ සහ සැපයුම් විශාල ප්‍රමාණයක් ද සෙබළුන් ද සහිත ව ගෝවේ සිට පිටත් ව ආ කපිතන් ජෙනරාල්ගේ යාත්‍රාවන් කොළඹ වරාය අසල දී හානියට ලක්වීම හේතුවෙන් සැලකිය යුතු සැපයුම් ප්‍රමාණයක් මුහුදුබත් විය (*The Temporal and Spiritual Conquest of Ceylon*, 1930: 479). කපිතන් ජෙනරාල් සූසාගේ ප්‍රධානත්වයෙන් සිදු කිරීමට සැලසුම් කරන ලද ක්‍රියාන්විතය වූයේ කන්ද උඩරට රාජධානියට සැබෑ ලේ උරුමකාරිය වූ කුසුමාසන දේවිය රැගෙන ගොස් උරුමයකින් තොර ව කන්ද උඩරට රාජ්‍යය අත්පත්කරගෙන සිටි 1වැනි විමලධර්මසූරිය රජු යුදමය වශයෙන් පරාජය කර කුසුමාසන දේවිය සිහසුනෙහි හිඳුවීම ය. එය කුසුමාසන දේවියට කන්ද උඩරට රාජ්‍ය උරුමය ලබා දීමේ අරමුණින් සිදුවූවක් නොව, පෘතුගීසීන්ට විරුද්ධ ව කන්ද උඩරට අත්පත් කරගෙන පෘතුගීසීන්ට අභියෝග කළ 1වැනි විමලධර්මසූරිය පරාජය කොට තමන්ට අවනත රූකඩ පාලනයක් කන්ද උඩරට ඇති කිරීමේ අවශ්‍යතාවය මත සිදු වූවක් බව පැහැදිලි ය.

මෙහි දී පෘතුගීසී හමුදාවේ පිරිස් බලය ශක්තිමත් කරමින් පෘතුගීසීන්ට සහය දීමට ඉදිරිපත් වූ මුදලිවරයෙක් විය. ඔහු 20,000 ක සිංහල සේනාවක් සහිත ව කපිතන් ජෙනරාල් සමග එක් වූ අතර දෝනකතරිනා කුමරිය රැජිණ වශයෙන් පිළිගැනීමට ද කැමැත්ත පල කළේය (*රිබෙයිරෝගේ ලංකා*

*ඉතිහාසය*, 2002: 83). මොහු සිංහල මුදලිවරයෙක් වූ බව රිබේරු දක්වතත් ශ්‍රී ලංකා ඉතිහාසයට අනුව ඔහු සොලී දේශයෙන් පැමිණ සීතාවක රාජ්‍යත්වය ගැනීමට තැත්කළ අරිට්ඨකී වෙන්ඩු පෙරුමාල් යැයි සඳහන් වේ (අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2016: 82-86). පසුකාලීන ව තම නාමය වෙනස්කරගත් ඔහු ජයවීර බණ්ඩාර යැයි නම් තබා ගනිමින් සිංහල හමුදාවක් සමග ගොස් පෘතුගීසීන් හා එක්විය. ඔහු සමග පෘතුගීසී හමුදාවට එක් වූ සිංහල හටයින් ලස්කරිඤ්ඤ හමුදාව යැයි හඳුන්වන අතර ඔවුන් හේතුවෙන් ශ්‍රී ලංකාවට ආගන්තුක වූ පෘතුගීසී හටයින්ට සහනයක් ලැබුණා සේම මගපෙන්වීම ද නිරායාසයෙන් ම ලැබුණු බව පෙනේ.

කන්ද උඩරට රාජ්‍ය උරුමය වූ කුසුමාසන දේවියත්, ජයවීර බණ්ඩාර ප්‍රමුඛ ලස්කරිඤ්ඤ හමුදාවත්, පෘතුගීසී හමුදාවත් රැගත් කපිතන් ජෙනරාල් පේරු ලෝපේස් ද සූසාගේ ක්‍රියාන්විතය කන්ද උඩරට දක්වා ගමන් ආරම්භ කරන ලදි. බලන කපොල්ල ඔස්සේ සෙංකඩගල දක්වා පැමිණෙන පෘතුගීසී හමුදාව පිළිබඳ සැලවූ 1වැනි විමලධර්මසූරිය රජු උපක්‍රමික ව සෙංකඩගලින් පසුබැස ගියේය (*රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය*, 2002: 83). එපමණක් ද නොව, කිසිඳු පහතරට බලවේගයකට ජයගත නොහැකි වූ බලන කපොල්ල පහසුවෙන් ජයගැනීමට පෘතුගීසීන්ට ඉඩකඩ විවර කරදෙන ලදි (Sri Lanka Military Academy, 2015: 13). බලන පසුකර පැමිණි පෘතුගීසි හමුදාවන් පළමු දින ගන්නෝරුවේ කඳවුරු ලාගත් අතර දෙවැනි දින කිසිඳු බාධාවකින් තොර ව සෙංකඩගල නුවර අත්පත් කරගත්තේය (එම: 13-14). කපිතන් ජෙනරාල්වරයා කැටුව පැමිණි කුසුමාසන දේවිය කන්ද උඩරට රැජිණ බවට පත්කොට රාජ්‍ය කටයුතු ආරම්භ කළ නමුත් සෙංකඩගල ජනතාවගේ සහය නොලද බැවින් පෘතුගීසී හමුදාවට සෙංකඩගල පරිපාලන කටයුතු පවත්වා ගැනීම අපහසු විය.

මේ අතරතුර උපක්‍රමික ව පෘතුගීසී බලය බෙදීමට කටයුතු කළ විමලධර්මසූරිය රජු ජයවීර බණ්ඩාරට යවන ආකාරයේ රහස් හසුනක් ලියවා එය පෘතුගීසීන්ට හසුවීමට සලස්වන ලදි. එහි සඳහන් ආකාරයට පෘතුගීසී හමුදාව සමග බලන දක්වා පැමිණ එහි දී තමන්ට එකතුවන ලෙස දක්වා තිබුණි (*රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය*, 2002: 84). මෙය කපිතන් ජෙනරාල්වරායට හසුවීමත් සමගින් ඔහු අතින් ජයවීර බණ්ඩාර මරණයට පත්විය. එහි ප්‍රතිඵලය වූයේ ජයවීර බණ්ඩාර යටතේ සිටි ලස්කරිඤ්ඤ හමුදාව පෘතුගීසීන් හැරගොස් විමලධර්මසූරිය රජු හා එක්වීමයි (Sri Lanka Military Academy, 2015: 16-17). මෙය පෘතුගීසී හමුදාවට දැවැන්ත හානියක් අත්පත් කළා සේම එමගින් ජනතා සහය ද නොලද පෘතුගීසීන් සෙංකඩගල හුදෙකලා තත්වයකට පත් වූ බව පෙනේ. මේ අනුව ක්‍රි.ව 1594 ඔක්තෝබර් 05 වැනි දින නැවතත් කොළඹ බලා පිටත් වීමට තීරණය කරන ලද කපිතන් ජෙනරාල්වරයා තමන් වෙත ඉතිරි වූ හමුදා හටයින්ගේ ආරක්ෂාව යටතේ නැවතත් කුසුමාසන දේවිය කැටුව කොළඹ බලා ගමන් ඇරඹීය (කොඩ්රිංටන්, 1998: 98).

කීරෝස් දක්වන ආකාරයට නැවත ගමන් කරමින් සිටි පෘතුගීසී හමුදාව සෙබළුන් 386 පමණ සුළු ප්‍රමාණයකින් යුක්ත විය (*The Temporal and Spiritual Conquest of Ceylon*, 1930: 487). මෙම පිරිස නැවත කොළඹ බලා ගමන් කරමින් සිටි අතරතුර ගන්නෝරුව සහ බලන අතර හමුවන දන්තුරේ ප්‍රදේශයේ දී විමලධර්මසූරිය රජුගේ හමුදාව ඔවුන්ට වටකර පහර දී පෘතුගීසී සේනාව විනාශ කරන ලදි (Sri Lanka Military Academy, 2015: 25). විමලධර්මසූරිය රජුගේ යුද ජයග්‍රහණයත්

සමගින් ඔහුට අත්පත් කරගත හැකි වූ කුසුමාසන දේවිය තම මෙහෙසිය කරගනිමින් ඔහු තම රාජ්‍යත්වයෙහි උරුමය ද තහවුරු කරගැනීමට සමත් විය. රිබේරු දක්වන්නේ ඔහු බලෙන් කුසුමාසන දේවිය අත්පත් කරගෙන ඇයට වද දී මිනිසුන් ඉදිරියේ ප්‍රසිද්ධියේ ඇයව දූෂණය කොට තම රාජ්‍ය අයිතිය ලබා ගත් බවයි (*රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය*, 2002: 86-87). නමුත් කුසුමාසන දේවියගේ උරුමය වූ කන්ද උඩරට රාජ්‍යයේ උරුමය ලබා ගැනීමට ඇයට ඇති එකම මාර්ගය එය වූ බැවින් සහ පෘතුගීසීන් යටතේ පාලනය වනවාට වඩා එය සිංහල රජකෙනෙකුන් යටතේ සිදුවීම හේතුවෙන් ඇයට පුද්ගලික ව අකමැති වීමට කරුණක් ද මෙහි නොමැති බව පෙනේ.

කෙසේ වුව ද දන්තුරේ සටනෙහි අවසන් ප්‍රතිඵලය වූයේ කන්ද උඩරට සම්බන්ධයෙන් එතෙක් පෘතුගීසීන් සතු ව පැවති අයිතිය ඔවුන් විසින් ම කන්ද උඩරටට රැගෙන විත් විමලධර්මසූරිය රජුට අත්පත් කරගැනීම පහසු කරවීමයි. කුසුමාසන දේවිය පෙරටුකරගෙන කන්ද උඩරට ජනතා සහය ලබා ගැනීමේ අරමුණින් පැමිණිය ද පෘතුගීසීන්ට පළමුවෙන් ම ජනතා සහය නොලැබීමෙන් ම එම උපක්‍රමය අසාර්ථක වූ බව පෙනේ. යුද්ධය සම්බන්ධ ෆෝකෝ න්‍යායෙහි එන ජනතා සහය සහිත පිරිසකට සාම්ප්‍රදායික හමුදාවක් පරදා ජයගත හැකිය යන්න (*ගරිල්ලා යුධ ක්‍රම*, 2004: 33) ඔප්පු කරමින් විමලධර්මසූරිය රජුගේ හමුදාවන් ජයගනු ලැබිණි. එබැවින් කන්ද උඩරට උරුමය පෙරටුකරගනිමින් සදාචාරාත්මක ව විමලධර්මසූරිය පරාජය කිරීමට ගත් පෘතුගීසී උපක්‍රමයට සාපේක්ෂ ව විමලධර්මසූරිය විසින් සැලසුම් කරන ලද උපක්‍රමයන් අතිශය සාර්ථක වූ බව පෙනේ. එබැවින් පෘතුගීසීන් ඇසුරේ හැදී වැඩුණු විමලධර්මසූරිය කන්ද උඩරට ජනතා සහය ද ලබා ගනිමින් යුද උපක්‍රමයන් ද මනාව හසුරුවමින් සැබෑ යුද ජයග්‍රහණයක් ලද අවස්ථාවක් වශයෙන් දන්තුරේ සටන හඳුන්වා දිය හැකිය.

## දන්තුරේ සටන් ව්‍යාපාරය විශ්ලේශනය.

දන්තුරේ සටන් ව්‍යාපාරය විශ්ලේශනය සඳහා යුද මූලධර්ම (Principles of war) යොදා ගැනීම සුදුසු බව පර්යේෂකයා යෝජනා කරයි. යුද මූලධර්මයන් පළමුවෙන් ම සටහන් තබන්නේ සන් ත්සු විසින් ක්‍රි.පූ 550 තරම් අතීතයේ දී ය. පසුකාලීන ව බටහිර දාර්ශනිකයින් විසින් විවිධාකාරයෙන් ගොඩනගන ලද යුද මූලධර්මයන්ගෙන් පසු ව ක්‍රි.ව 1812 දී කාල් වැන් ක්ලවුස්විට්ස් විසින් යුද මූලධර්ම නමින් ලියන ලද සටහනින් වර්තමාන යුද මූලධර්මයන්ට සැබෑ පසුබිම සකස් කරන ලදි (*Principles of war*, 2003: 1-96). ප්‍රායෝගික යුද අත්දැකීම් ද යොදා ගනිමින් පළමු ලෝක යුද්ධයෙන් පසු ව රාජකීය හමුදාව විසින් දස වැදැරුම් යුද මූලධර්මයන් නිර්මාණය කරගන්නා ලදි. පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍යයන් බහුතරයක් සුළු වෙනස්කම් සහිත ව මෙකී දස වැදැරුම් යුද මූලධර්මයන් තම රාජ්‍යයන් හි දී භාවිත කරනු ලබයි (Doctrine Cell, 2012: 36., Indian Army, 2004: 25). ශ්‍රී ලංකාව වර්තමානය වන විට ද කිසිඳු වෙනසකින් තොර ව බ්‍රිතාන්‍ය රාජකීය හමුදාව විසින් ශ්‍රී ලංකාවේ නිදහසට පෙර භාවිත කරන ලද දස වැදැරුම් යුද මූලධර්මයන් එලෙසින් ම භාවිත කරනු දැකගත හැකිය (Sri Lanka Military Academy, 2012: 601).

ක්‍රි.ව 1594 දී ශ්‍රී ලංකාවේ කන්ද උඩරට ප්‍රදේශයෙහි සිදු වූ දන්තුරේ සටන විශ්ලේශනය කරනු වස් පසුකාලීන ව නිර්මාණය කරගන්නා ලද යුද මූලධර්මයන් භාවිත කිරීමක් මෙහි දී සිදු වන බව

සත්‍යයකි. නමුත් යුද්ධයක් සංකල්පමය වශයෙන් විග්‍රහ කරන යුද මූලධර්මයන් ඕනෑම කලෙක පැවති යුද්ධයක් විශ්ලේෂනය කරනු වස් යොදා ගැනීමේ හැකියාවක් පවතින අතර මෙම විශ්ලේශනය දස වැදෑරුම් යුද මූලධර්මයන්ට සීමා නොවී ශ්‍රී ලංකාවේ පාරම්පරික යුද ඥානය අනාවරණය කරගැනීමේ අවශ්‍යතාවය මත සිදුකරන්නක් වේ. දස වැදෑරුම් යුද මූලධර්මයන් විශ්ලේශනයට අවශ්‍ය සංකල්පමය පදනමක් වශයෙන් භාවිත කරනු ලබයි.

**අරමුණ තෝරා ගැනීම සහ පවත්වා ගැනීම.**

දන්තුරේ සටනට අදාළ ප්‍රධාන පාර්ශ්වයන් ද්විත්වය වන්නේ කන්ද උඩරට රාජධානියේ පාලකයා වූ 1 වැනි විමලධර්මසූරිය රජු සහ පෘතුගීසීන් ය. කන්ද උඩරට පාලකයා වූ 1 වැනි විමලධර්මසූරිය රජුගේ පාර්ශ්වයෙන් සැලකුකල අරමුණ වන්නේ කන්ද උඩරට පාලකයා වශයෙන් ස්ථාවර පාලනයක් පවත්වා ගැනීමයි. ඒ සඳහා පවතින එක ම අභියෝගය වන පෘතුගීසීන් පරාජය කිරීම ඔහුගේ අරමුණ වූ බව පැහැදිලි ය. එය විමලධර්මසූරිය රජුගේ පුද්ගලික අරමුණ වූ අතර රාජ්‍යයක් වශයෙන් කන්ද උඩරට රාජ්‍යයේ අවශ්‍යතාවය වූයේ ද බොහෝ කාලයක් උත්සහ ගත්තා සේම ස්වාධීන රාජ්‍යයක් ලෙස නැගී සිටීම යි. මේ අනුව පැහැදිලි වන්නේ විමලධර්මසූරිය රජුගේ පුද්ගලික අරමුණ සහ කන්ද උඩරට රාජ්‍යයේ පොදු අරමුණ යන කාරණාවන් ද්විත්වය ම එකම දිශානතියක් සහිත ඒවා වූ බවයි.

අරමුණ පවත්වා ගැනීම සම්බන්ධයෙන් සැලකීමේ දී ද විමලධර්මසූරිය රජුගේ පාර්ශ්වයෙන් තම අරමුණ සටන් ව්‍යාපාරය පුරාවට ම පවත්වා ගත් බවක් දැකිය හැකිය. දන්තුරේ සටන යනු තනි ව ගෙන විශ්ලේශනය කළ නොහැකි කාරණාවක් වන බැවින් බලන කපොල්ලෙන් කන්ද උඩරටට ඇතුළු වීමේ සිට දන්තුරේ දී සටන සිදු වී අවසන් වන තෙක් සිදුවීම් සියල්ල දන්තුරේ සටන් ව්‍යාපාරය වශයෙන් සැලකිය හැකි වන්නේ ය. දන්තුරේ සටන් ව්‍යාපාරයේ දී විමලධර්මසූරිය රජුගේ අරමුණ වූයේ සටන ජයග්‍රහණය කිරීම මිස කුසුමාසනදේවිය අත්පත් කරගැනීමක් නොවේ. යුද්ධයේ අවසන ඇය තමන්ට හිමි වුණ ද සටන ආරම්භයට පෙර ඇය හිමිකරගැනීම ඔහුගේ අරමුණ ලෙස පැවති බවක් නොපෙනේ.

කන්ද උඩරට රාජ්‍යයේ සහ පාලකයාගේ අරමුණ තෝරා ගැනීම සහ එය පවත්වා ගැනීම ස්ථාවර මට්ටමක පැවතිය ද පෘතුගීසීන් සම්බන්ධයෙන් බැලීමේ දී ගැටළු රැසක් පැවති බව පෙනේ. පෘතුගීසීන් විසින් කන්ද උඩරට රාජ්‍යය වෙත මුල් වරට එවූ යමසිංහ බණ්ඩාරගේ සහ කොනප්පු බණ්ඩාරගේ අරමුණ වූයේ සීතාවක රාජසිංහ රජුගෙන් එල්ල වූ පීඩනය අවම කර ගැනීමයි (සෝමතිලක, 2009: 15). එහි ප්‍රතිඵලයක් ලෙස තමන්ගේ ආරක්ෂාව ලැබූවෙකු තමන්ට එරෙහි ව යමින් කන්ද උඩරට රාජ්‍යත්වයට පත් වූ බැවින් දන්තුරේ සටන අවස්ථාව වන විට පෘතුගීසීන්ට පැවති මූලික අවශ්‍යතාවය වූයේ ඔහුගෙන් පළිගැනීම බව පෙනේ. අනෙක් අතට 1 වැනි විමලධර්මසූරිය රජවීමත් සමග ම කන්ද උඩරට ආක්‍රමණයට පැමිණි සීතාවක රාජසිංහ රජු පැරදී පළායන අතරතුර මියයෑම හේතුවෙන් පෘතුගීසීන්ට පැවති ප්‍රධානත ම බාධකය ඉවත් වී තිබුණි (කොඩ්රිංටන්, 1998: 97). එබැවින් සීතාවක රාජ්‍යයෙන් තමන්ට තිබූ බාධාව ඉවත් වී තිබුණු නමුත් එම රාජ්‍යය තව දුරටත් සීතාවක රාජසිංහ රජුගේ සහෝදරියක මාර්ගයෙන් ස්වාධීන වී තිබුනු බැවින් (අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2016: 84-85) පෘතුගීසීන් වෛරයකින් කන්ද උඩරට

ආක්‍රමණය නොකළේ නම් ඔවුන් විසින් තෝරාගත යුතු පළමු ක්‍රියාන්තවිතය විය යුත්තේ සීතාවක තම පාලනය යටතට ගැනීම යි. නමුත් ඒ සඳහා ඔවුන් ගත් පළමු උත්සහය අරිට්ඨ කී වෙන්ඩු පෙරුමාල් නොහොත් එවක මාන්නම්පෙරුම මොහොට්ටාල යැයි නම් ලැබූ පසුකාලීන ජයවීර බණ්ඩාර බවට පත් වූ අය විසින් ව්‍යර්ථ කරන ලදි (එම: 85). ඉන් පසු පෘතුගීසීන් ඒ සඳහා නැවත උත්සහ කළ බවක් නොපෙනේ. මේ අනුව පෘතුගීසීන්ගේ පාර්ශ්වයෙන් අරමුණ තෝරා ගැනීම සම්බන්ධයෙන් විශ්ලේශනය කරන කල්හි එය පහත පරිදි විවිධාකාර වූ බව පෙනේ.


1. **පෘතුගීසීන්ගේ ප්‍රාථමික අවශ්‍යතාවය** - 1 වැනි විමලධර්මසූරිය රජු පරාජය කිරීම.

2. **පෘතුගීසීන්ගේ ද්විතීයික අවශ්‍යතාවය** - කන්ද උඩරට රාජ්‍යය තමන්ගේ යටතට ගැනීම.

3. **පේරූ ලෝපේස් ද සූසාගේ ප්‍රාථමික අවශ්‍යතාවය** - කන්ද උඩරට කුසුමාසන දේවිය රජකරවා තම බෑණා සරණපාවා දී පාලනය ලබා ගැනීම.

3. **පේරූ ලෝපේස් ද සූසාගේ ද්විතීයික අවශ්‍යතාවය** - 1 වැනි විමලධර්මසූරිය රජු පරාජය කොට කන්ද උඩරට පාලනය පෘතුගීසීන් යටතට ගැනීම.

තනි අරමුණක් පවත්වා ගැනීම ජයග්‍රහණය වෙනුවෙන් අත්‍යවශ්‍ය කාරණාවක් වුව ද (Ministry of Defense, 2014: 30) පෘතුගීසීන්ගේ අරමුණ තෝරා ගැනීමේ පැවති ගැටළුකාරී තත්වය පහත පරිදි වූ ත්‍රිවිධාකාර ඉලක්කයන් වෙත සම්බන්ධ වී තිබූ බව දැකගත හැකිය.




1 රූපය - පෘතුගීසී පාර්ශ්වයේ අරමුණ තෝරා ගැනීමේ ගැටළුකාරී තත්වය

අරමුණ තෝරා ගැනීම සම්බන්ධයෙන් පෘතුගීසී පාර්ශ්වයේ පැවති ගැටළුකාරී තත්වය හේතුවෙන් ඔවුන් විසින් සිදු කරන ලද අවාසිදායක ම ක්‍රියාව වූයේ කුසුමාසන දේවිය පෙරටු කරගනිමින් කන්ද උඩරට වෙත ගමන් ගැනීම ය. එමගින් ඔවුන් ලබා ගැනීමට අපේක්ෂා කළ ජනතා සහය කිසිඳු අවස්ථාවක ඔවුන් වෙත නොලැබුණ හෙයින් ඔවුන් වෙත තිබූ අවසන් ලේ උරුමක්කාරිය ද අහිමි වී ගියේ ය. එබැවින් පෘතුගීසීන් පළමු උත්සහය හමුදාමය ක්‍රියාවකට පමණක් සීමා කළේ වී නම් උපරිම අත්පත් කරගැනීම වශයෙන් කන්ද උඩරට අත්පත් කරගෙන විමලධර්මසූරිය පරාජය කිරීම හෝ උපරිම අහිමිවීම වශයෙන් තම පාර්ශ්වය පරාජයට පත්වීම පමණක් සිදුවීමට ඉඩකඩ තිබුණි. එසේ පරාජය වුව ද තව දුරටත් කන්ද උඩරට සඳහා වූ තම අයිතිය පවත්වා ගැනීමට කුසුමාසන දේවිය ඔවුන් සතු ව සිටීම විශාල වාසියක් වීමට ඉඩකඩ තිබුණි.

අරමුණ පවත්වා ගැනීම අතින් ද පෘතුගීසීන් සාර්ථක නොවූයේ මුලදී එය විමලධර්මසූරිය පරාජය කිරීම ලෙස පැවතිය ද, පසුව එය කන්ද උඩරට අත්පත් කරගැනීම බවට ද, ඉන් පසුව කන්ද උඩරට පාලනය පවත්වා ගැනීම බවට ද, අවසානයේ ප්‍රාණය රැකගෙන පසුබැසීම බවට ද, පත්වූ බැවිනි. විමලධර්මසූරිය පරාජය කිරීමේ ප්‍රාථමික අරමුණ පෘතුගීසීන් විසින් දිගින් දිගට ම පවත්වා ගත්තේ නම් කන්ද උඩරටට පැමිණි සැනින් සූසාගේ මීළඟ ක්‍රියාව විය යුතු ව තිබුණේ පසුබැස සිටි විමලධර්මසූරිය රජු සොයා ගොස් පරාජය කිරීමයි. එම අරමුණ පවත්වා ගත්තේ නම් දන්තුරේ සටනක් සිදු නොවනු ඇති අතර ශ්‍රී ලාංකේය ඉතිහාසය ද මීට හාත්පස වෙනස් වීමට බොහෝ සෙයින් ඉඩකඩ තිබුණු බව පෙනේ.

- <u>**චිත්ත ධෛර්යය පවත්වා ගැනීම.**</u>

චිත්ත ධෛර්යය පවත්වා ගැනීම ජයග්‍රහණය ලබා ගැනීම විෂයෙහි අත්‍යවශ්‍ය අංගයක් වන්නේ ය (Indian Army, 2004: 23-24). දන්තුරේ සටනට අදාළ සටන් ව්‍යාපාරය තුළ කන්ද උඩරට පාර්ශ්වයේ චිත්ත ධෛර්යය සම්බන්ධයෙන් සැලකීමේ දී ඔවුන්ගේ චිත්ත ධෛර්යය ධනාත්මක ව සහ ඍණාත්මක ව බලපෑ සාධකයන් පහත පරිදි වෙන්කොට හඳුනාගත හැකි වෙයි.

<u>ධනාත්මක කාරණාවන්</u>

1. කන්ද උඩරට ජනතා අවශ්‍යතාවය වූ ස්වාධීනත්වය අත්පත්කරගෙන තිබීම.
2. කන්ද උඩරට ජනතා සහය විමලධර්මසූරිය රජුවෙත පැවතීම.
3. පෘතුගීසීන් වෙතින් ගෝවේ දී වසර 3 ක් යුද පුහුණුව ලැබූ විමලධර්මසූරිය ඔවුන් පිළිබඳ මනා අවබෝධයකින් සිටීම.
4. භූමියෙහි වාසිය කන්ද උඩරට පාර්ශ්වය වෙත පැවතීම.
5. සතුරා සමග ඔහුට නොදැනෙන්නට සම්බන්ධ වී සිටීමේ වාසිය හේතුවෙන් සතුරාගේ චර්යාවන් නිතර දැකීම.
6. තම සැලසුමට අදාළ උපක්‍රමයන් සාර්ථක ව ඉටු කරගැනීමට හැකිවීම.

<u>ඍණාත්මක කාරණාවන්</u>

1. කන්ද උඩරට ලේ උරුමය වූ කුසුමාසන දේවිය පෘතුගීසීන් සතුවීම.
2. ජයවීර බණ්ඩාරගේ 20,000 ක හමුදාවක් පෘතුගීසීන් හා එක්වීම.
3. පෘතුගීසීන් වෙත දියුණු අවි ආයුධ සහ පුහුණු භටයින් සිටීම.

තම චිත්ත ධෛර්යය පවත්වා ගැනීම උදෙසා වැඩි ධනාත්මක කාරණාවන් සහිත ව සිටි කන්ද උඩරට පාර්ශ්වය යුද්ධයේ සියලු අධියරයන් හි දී තම චිත්ත ධෛර්යය වැඩි දියුණු කරගනිමින් පවත්වා ගැනීමට සමත් වූ බව දැකිය හැකිය. ඔවුන් විසින් සැලසුම් කරන ලද සියලු අවස්ථාවන් ප්‍රායෝගික ව ක්‍රියාත්මක වීම හේතුවෙන් ඔවුන් වෙත ජයග්‍රහණය පිළිබඳ පැවති විශ්වාසය වැඩි දියුණු විය.

පෘතුගීසී පාර්ශ්වයෙන් බලන කල ඔවුන්ගේ චිත්ත ධෛර්යය පවත්වා ගැනීමට බලපාන ලද දන්තුරේ සටන් ව්‍යාපාරය තුළ දැකිය හැකි සාධකයන් සහ සිදුවීම් පහත පරිදි වෙන්කොට හඳුනාගත හැකි වෙයි.

**ධනාත්මක කාරණාවන්**

1. කන්ද උඩරට ජනතා අවශ්‍යතාවය වූ ස්වාධීනත්වය අත්පත්කරගෙන තිබීම.

2. කන්ද උඩරට ජනතා සහය විමලධර්මසූරිය රජුවෙත පැවතීම.

3. පෘතුගීසීන් වෙතින් ගෝවේ දී වසර 3 ක් යුද පුහුණුව ලැබූ විමලධර්මසූරිය ඔවුන් පිළිබඳ මනා අවබෝධයකින් සිටීම.

4. භූමියෙහි වාසිය කන්ද උඩරට පාර්ශ්වය වෙත පැවතීම.

5. සතුරා සමග ඔහුට නොදැනෙන්නට සම්බන්ධ වී සිටීමේ වාසිය හේතුවෙන් සතුරාගේ චර්යාවන් නිතර දැකීම.

6. තම සැලසුමට අදාළ උපක්‍රමයන් සාර්ථක ව ඉටු කරගැනීමට හැකිවීම.

**සෘණාත්මක කාරණාවන්**

1. කන්ද උඩරට ලේ උරුමය වූ කුසුමාසන දේවිය පෘතුගීසීන් සතුවීම.

2. ජයවීර බණ්ඩාරගේ 20,000 ක හමුදාවක් පෘතුගීසීන් හා එක්වීම.


3. පෘතුගීසීන් වෙත දියුණු අවි ආයුධ සහ පුහුණු භටයින් සිටීම.

චිත්ත ධෛර්යය පවත්වා ගැනීම කෙරෙහි ධනාත්මක ව බලපාන ලද කාරණාවන් වශයෙන් පෘතුගීසීන් ඉදිරියේ පැවතියේ කුසුමාසන දේවියගේ අයිතියත්, ජයවීර බණ්ඩාරගේ සම්බන්ධවීමත්, තමන් වෙත පැවති යුද ශක්තියත් පමණි. නමුත් පේරු ලෝපේස් ද සූසා ගෝවෙන් පිටත් වූ මොහොතේ සිට දන්තුරේ සටන අවසන් වනතුරු ම ඔවුන් දිගින් දිගට ම චිත්ත ධෛර්යය බිඳවැටීමේ සිදුවීම් රැසකට මුහුණපාන ලදි. එබැවින් කන්ද උඩරට පාර්ශ්වයට සාපේක්ෂ ව පෘතුගීසීන් චිත්ත ධෛර්යය පවත්වා ගැනීම අතින් පසුගාමී තත්වයක පසු වූ බව මනාව පැහැදිලි වේ.

- **<u>ප්‍රහාරාත්මක ක්‍රියාව.</u>**

යුද ජයග්‍රහණයක් සඳහා අවශ්‍ය ම ලක්ෂණයක් වන්නේ ප්‍රහාරාත්මක බවයි (Ministry of Defense, 2014: 30). එසේ ම එය ඕනෑම සටනක දී මුලපිරීමේ හැකියාව තම පාර්ශ්වය වෙත ලබා ගැනීමට ඉවහල් වන්නේ ය (Indian Army, 2004: 23). ප්‍රහාරාත්මක බව පවත්වා ගැනීමට අවශ්‍ය වන මූලික ම කාරණාව වන්නේ සතුරාට නොදැනී සතුරා සමග සම්බන්ධ වී සිටීමයි. එමගින් සතුරු ක්‍රියාවන් නිරීක්ෂණට කොට සුදුසු ම අවස්ථාවේ දී සතුරා වෙත පළමු ප්‍රහාරය එල්ල කිරීමේ හැකියාව තමන් වෙත තබා ගැනීමට හැකි වේ.

දන්තුරේ සටන් ව්‍යාපාරය තුළ ප්‍රහාරාත්මකබව යන්න කුමන පාර්ශ්වයක් සතු ව පැවතියේ දැයි මෙහිදී විමසා බැලීය යුතු වන්නේ ය. ඒ සඳහා අත්‍යවශ්‍ය වූ සාධකයන් හි වාසිය කුමන පාර්ශ්වය සතුවීදැයි පහත රූපසටහනින් මනාව පැහැදලි කෙරේ.




2 රූපය - ප්‍රහාරාත්මක ක්‍රියාව පවත්වා ගැනීමට අවශ්‍ය සාධකයන්

ප්‍රහාරාත්මකබව පවත්වා ගැනීමට අත්‍යවශ්‍ය කාරණය වන්නේ සතුරාට නොදැනී සතුරා සමග සම්බන්ධ වී සිටීමයි. පෘතුගීසීන් බලන කපොල්ලෙන් ඇතුළු වීමේ සිට සෙංකඩගලට පැමිණෙන අවස්ථාව දක්වාත්, එතැන් සිට සෙංකඩගල පාලන කටයුතු පවත්වා ගැනීමට උත්සහ ගත් අවස්ථාවේදීත්, අවසානයේ සෙංකඩගල හැරදා නැවත කොළඹ බලා ගිය ගමනේදීත් ඔවුන්ගේ චර්යාවන් මනාව නිරීක්ෂණය කිරීමට විමලධර්මසූරිය රජුට හැකිවිය. තමන් වෙත ජනතා සහයෝගය පැවතීම සහ තම බුද්ධි තොරතුරු ජාලය ඔස්සේ තම භූමියේ දී ආගන්තුක පාර්ශ්වයක් පිළිබඳ බුද්ධි තොරතුරු රැස්කිරීම යන්න විමලධර්මසූරිය රජුට පහසු කාර්යයක් වූ බව පෙනේ. තව ද තමා මනාව දන්නා භූමියේ දී ඊට අතිශය ඔබින යුද ක්‍රමයන් භාවිත කරමින් ප්‍රහාරාත්මකබව පවත්වා ගැනීමට ඇති හැකියාව යන්න විමලධර්මසූරිය රජුගේ කන්ද උඩරට පාර්ශ්වය වෙත වාසිසහගත තත්වයක් ජනිත කිරීමට සමත්විය.

පෘතුගීසීන් සම්බන්ධයෙන් බැලීමේ දී තත්වය හාත්පස වෙනස් වූ බව පෙනේ. බලන කොටුවේ දී හමුවූ සරල බාධකයන් පරාජය කරමින් කන්ද උඩරටට ඇතුළු වූ අවස්ථාවේ සිට දන්තුරේ දී විමලධර්මසූරිය රජුගේ හමුදාවෙහි රැකසිට පහරදීමට ලක්වන තුරු ම පෘතුගීසීන් සතුරා සමග සම්බන්ධ වී නොසිටියේ ය. ජනතා සහයක් නොලද බැවින් සහ තමන්ගේ ම බුද්ධි තොරතුරු ජාලයක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ඔවුන්ට සතුරාගේ ස්ථානගතවීම්, සැලසුම් සහ ක්‍රියාකාරකම් පිළිබඳ ව කිසිඳු අදහසක් ඇති කරගැනීමට ද නොහැකි විය. එසේ ම ජයවීර බණ්ඩාරගේ සේනාවන් හැරගිය පසු තමන්ට ආගන්තුක භූමිය දී උපක්‍රමික ස්ථානයන් පිළිබඳ කිසිඳු අදහසක් නොමැති ව භූමියට නොගැලපෙන යුද ක්‍රමයක් සමගින් ප්‍රහාරාත්මකබව රඳවා ගැනීම යන්න කළ නොහැකි කාරණාවක් වූ බව පෙනේ.

මේ අනුව පැහැදිලි වන්නේ ප්‍රහාරාත්ම ක්‍රියාව යන්න පෘතුගීසීන්ට සාපේක්ෂ ව උපරිමයෙන් ම කන්ද උඩරට පාර්ශ්වය සතු ව පැවති බවයි. මෙම සටනේ තීරණාත්මක ගැටීම සිදු වූ දන්තුරේ දී අවස්ථාව තෝරා ගැනීමත්, ස්ථානය තෝරා ගැනීමත්, ප්‍රහාරය සැලසුම් කිරීමත්, සුදුසුම අවස්ථාවේ දී එය දියත් කිරීමත් යන සියලු කාරණාවන් තීරණය කිරීමේ හැකියාව කන්ද උඩරට පාර්ශ්වය සතු වූයේ ඉහත විශ්ලේශනය කළ ප්‍රහාරාත්මක ක්‍රියාවෙහි වාසිය ඔවුන් වෙත පැවති බැවිනි.

- **<u>විශ්මය.</u>**

යුද මූලධර්මයක් වශයෙන් ගත්කළ විශ්මය යන්න යුද්ධයක අවසන් තීරණය කෙරෙහි මහත් වූ බලපෑමක් එල්ල කරන්නා වූ සාධකයක් වේ. යුද්ධයක් තුළ දී වඩාත් ම බලසම්පන්න වන්නේ තමන් විසින් බලාපොරොත්තු නොවූ දෙය වන බැවින් (Whaley, 1969: 86) සෑම මිලිටරි ක්‍රියාකාරීත්වයක් තුළ ම එය අඩු වැඩි වශයෙන් පවතින්නේ ය (Erfurth, 1983: 18). ඒ බව තවදුරටත් සහතික වන්නේ එක්සත් රාජධානිය ප්‍රමුඛ පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල් වල මෙන් ම එක්සත් ජනපදය සහ රුසියානු යුද හමුදාවන් හි යුද මූලධර්මයන් අතර විශ්මය යන්න පොදුවේ භාවිත වන බැවිනි.

විශ්මය යන්න සමගින් ම භාවිතවන තවත් සාධකයක් වන්නේ රැවටීම යන්නයි. සන් ත්සූට අනුව සියළුම යුද ක්‍රමයන් රැවටීම මත පදනම් වී තිබේ (*Art of War by Sun Tzu*, 1910). රැවටීම යනු සතුරා නොමග යැවීමක් වන බැවින් එය එක් ආකාරයක විශ්මය ජනිත කරන්නා වූ ක්‍රමයක් ද වන්නේ ය. දන්තුරේ සටන් ව්‍යාපාරයට අනුව මෙකී විශ්මය සහ රැවටීම භාවිත වූ ආකාරය විමසා බැලීම වැදගත් වේ. කන්ද උඩරට පාර්ශ්වයෙන් ගත කළ ඔවුන් විසින් කළ පළමු රැවටීම වන්නේ සුළු බාධකයන් ප්‍රමාණයක් යොදා බලන කපොල්ලෙන් ඇතුළු වීමට පෘතුගීසීන්ට ඉඩප්‍රස්ථාව ලබා දීමයි. සැබැවින් ම මෙය උපක්‍රමික රැවටීමක් වන්නේ ඊට වසරකට පෙර කන්ද උඩරට ආක්‍රමණය කිරීමට පැමිණි සීතාවක රාජසිංහ රජු පවා බලන කපොල්ලෙන් ඇතුළු වීමට නොහැකි ව නැවත පසුබා ගිය ද පෘතුගීසීන්ට එය ජයගැනීමට ඉඩදීම නිසාවෙනි. නමුත් පෘතුගීසීන් මෙම රැවටීම මනාව තෝරුම් නොගත් අතර ඔවුන් එය සැලකුයේ තම යුද ශක්තිය ඉදිරියේ විමලධර්මසූරිය ලද පරාජයක් ලෙසින් ය. එබැවින් මෙම අවස්ථාව පෘතුගීසීන් මනාව වටහා නොගත් විශ්මයක් වශයෙන් පවතී.

විමලධර්මසූරිය සමස්ත දන්තුරේ සටන් ව්‍යාපරය තුළ දී ම මනාව විශ්මය භාවිත කළ බව දැකගත හැකි වන්නේ ඔහුගේ දෙවැනි විශ්මය දනවන ක්‍රියාව වූ සෙංකඩගලින් පසුබා යෑම හේතුවෙනි. එය කාරණාවන් කිහිපයක් හේතුවෙන් සිදුකළා විය හැකිය.

1. පෘතුගීසී සහ ජයවීර බණ්ඩාරගේ හමුදාවන් හි ප්‍රමාණය සහ අවි ආයුධ වල ශක්තිය හේතුවෙන් හානි අවම කරගැනීම.

2. පෘතුගීසීන් හා ඍජු සටනකට පිවිසීමෙන් සෙංකඩගලට වියහැකි හානිය අවම කරගැනීම.

3. සතුරා පිළිබඳ අධ්‍යයනයට අවශ්‍ය කාලය ලබා ගැනීම.

4. ප්‍රහාරයකට සුදුසු වටපිටාව සකස් කරගැනීම.

5. හානි අවම වන ආකාරයේ ප්‍රහාරයකට කාලය සහ ස්ථානය තෝරා ගැනීම.


මෙහි දෙවැනි විශ්මය ක්‍රියාව නොහොත් විමලධර්මසූරියගේ රැවටීම පෘතුගීසීන් නැවතත් තම ජයග්‍රහයණයක් වශයෙන් සිතූ අතර එය තමන්ට මුහුණ දීමට නොහැකි ව පළායෑමක් වශයෙන් භාරගන්නා ලදි.

විමලධර්මසූරිය රජු විසින් පෘතුගීසී වෙත විශ්මය ජනිත කළ තෙවැනි අවස්ථාව වූයේ ඔවුන්ගේ පිරිස් බලය සහ මගපෙන්වීම බවට පත් ව සිටි ජයවීර බණ්ඩාර බෙදා වෙන් කිරීම යි. සන් ත්සූ මෙම යුද උපක්‍රමය විස්තර කර ඇත්තේ ''සතුරාගේ සේනා එක්සත් නම් එය බෙදා දමන්න'' (*Art of War by Sun Tzu*, 1910) යනුවෙනි. එය රහස් සන්දේශයක් පෘතුගීසීන් අතට පත්කිරීම මගින් ඔවුන් ඔස්සේ ම සිදුකරවා ගැනීමට තරම් විමලධර්මසූරිය රජු උපක්‍රමික විය. මෙහි ප්‍රතිඵලය වූයේ පෘතුගීසී හමුදාවෙහි පිරිස් බලය පෙරෑ ලෝපේස් ද සූසා සමගින් පැමිණි 1,200 ආසන්න සෙබළ සංඛ්‍යාව (*රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය*, 2002: 83) දක්වා නැවතත් පහත වැටීම යි.

මීට සමගාමී ව පෘතුගීසීන් විසින් මුහුණදෙන ලද තවත් විශ්මය දනවන කාරණාවක් විය. එනම් කන්ද උඩරට රාජ්‍යය වෙනුවෙන් සැබෑ ලේ උරුමය වූ කුසුමාසන දේවියට කන්ද උඩරට ජනතා සහයෝගය නොලැබී යෑමයි. පෘතුගීසීන්ගේ මැදිහත්වීම හේතුවෙන් එය නිරායාසයෙන් ම සිදුවන බව (කොඩ්රිංටන්, 1998: 98) විමලධර්මසූරිය දැන සිටියා හෝ කන්ද උඩරට ජනතාව තමන්ට පක්ෂපාතබව ඔහු විසින් දැන සිටියා හෝ විය හැකිය. කෙසේ වුව ද එහි ප්‍රතිඵලය වූයේ ජීවිතාරක්ෂාව පතා පෘතුගීසීන් නැවතත් කොළඹ බලා ගමන් ආරම්භ කිරීම යි.

පෘතුගීසීන් විසින් මුහුණ දෙන ලද අවසන් විශ්මය දනවන සිදුවීම වූයේ තම කුඩා හමුදාවට නොසිතූ අවස්ථාවක, නොසිතූ ස්ථානයක දී, නොසිතූ ආකාරයෙන්, ප්‍රහාරයක් එල්ල වීමයි. දන්තුරේ කඳු සහ වනගත ප්‍රදේශයෙ හි සැඟවී සිට පෘතුගීසී හමුදාවන් ඒ ඔස්සේ ගමන් ගන්නා විට වටලා පහරදීමක් සිදු කළ විමලධර්මසූරිය රජුගේ හමුදාව පෘතුගීසීන් පරාජයට පත්කරන ලදි.

මේ ආකාරයට එක් එක් අවස්ථාවන් හී දී ඒ ඒ අවස්ථාවන්ට උචිත ආකාරයට කන්ද උඩරට පාර්ශ්වය විසින් යොදාගන්නා ලද විශ්මය යුද්ධයේ අධියරයන් අනුව පහත පරිදි සම්පිණ්ඩණය කොට දැක්විය හැකි ය.




3 රූපය - දන්තුරේ සටන් ව්‍යාපාරය තුළ කන්ද උඩරට පාර්ශ්වය විසින් විශ්මය යොදාගැනීම.

පෘතුගීසී පාර්ශ්වයෙන් විශ්ලේශනය කරන විට යුද්ධයේ කිසිඳු අධියරයක දී ඔවුන් විසින් සාර්ථක ආකාරයට විශ්මය යන්න යොදාගත් බවක් දැකිය නොහැකි ය. සාමාන්‍යයෙන් යුද්ධයක ප්‍රහාරාත්මක තත්වයේ දී හෝ ආරක්ෂිත තත්වයේ දී යුද්ධ හමුදාවකට විශ්මය යන්න යොදාගනිමින් සතුරා අඩපණ කිරීමේ හැකියාවක් පවතී (Clark, 1987: 1). නමුත් පෘතුගීසීන් විසින් මෙකී කිසිඳු අවස්ථාවක දී සාර්ථක විශ්මය ජනිත කිරීමක් භාවිත නොකරන ලදි.

පෘතුගීසීන් විසින් විමලධර්මසූරිය රජු වෙත යම් හෝ විශ්මයක් ජනිත කළ අවස්ථාව වශයෙන් සැලකිය හැක්කේ ජයවීර බණ්ඩාරගේ 20,000 ක හමුදාව තමන් වෙත එකතු කරගනිමින් විශාල පිරිස් බලයක් සහ අවි බලයක් සහිත හමුදාවක් සමගින් කන්ද උඩරටට පැමිණීම යි. නමුත් ඒ සඳහා විමලධර්මසූරිය තම උපක්‍රමයන් දියත් කරමින් පෘතුගීසීන් වෙත ප්‍රතිවිශ්මයක් ජනිත කරමින් ඔවුන් සෑම අධියරයක දීම දැනුවත් ව හෝ නොදැනුවත් ව හෝ පරාජයට පත් කිරීමට සමත් විය.

- **බල සංකේන්ද්‍රණය.**

යුද මූලධර්මයන් හි එන බල සංකේන්ද්‍රණය යන්නෙන් අදහස් වන්නේ හමුදාවක ප්‍රහාරාත්මක ශක්තිය අවශ්‍ය අවස්ථාවේ දී අවශ්‍ය ස්ථානයට යොදා ගැනීම සම්බන්ධයෙන් පවතින හැකියාව යි (Sri Lanka Military Academy, 2015: 38). යුද්ධ හමුදාව කොතෙක් පිරිස් බලයක් සහ අවි බලයක් පැවතිය ද අවශ්‍ය අවස්ථාවේ දී අවශ්‍ය ස්ථානයට එය ඒකරාශී කරගැනීමට නොහැකි වන්නේ නම් එම පාර්ශ්වය අවදානමට ලක්වන බව මෙයින් කියැවේ. මෙම මූලධර්මය තව දුරටත් සහතික කරනු වස් ඉන්දීය දාර්ශනික කවුටිල්‍ය විසින් රචිත අර්ථශාස්ත්‍රයේ එන අෂ්ඨ යුද උපායමර්ගයන් හි ප්‍රමුඛ අංගයන් ද්විත්වයක් වූ ස්ථානය සහ වේලාව යන්න දැක්විය හැකිය (*The Arthashastra*, 1992: 50-78).

දන්තුරේ සටන් ව්‍යාපාරය තුළ බල සංකේන්ද්‍රණය යන්න කන්ද උඩරට පාර්ශ්වයෙන් සහ පෘතුගීසී පාර්ශවයෙන් ප්‍රායෝගික ව පවත්වා ගත් ආකාරය විමසා බැලීම මෙහිදී වැදගත් වේ. කන්ද උඩරට විමලධර්මසූරිය රජුගේ පාර්ශ්වයෙන් සලකා බලන කල පෘතුගීසීන් ජයවීර බණ්ඩාර සමග ඒකාබද්ධ වී කන්ද උඩරටට පැමිණෙන අවස්ථාවේ දී ඔවුන්ට මුහුණ නොදීම යන්න තම බල සංකේන්ද්‍රණය පිළිබඳ ව වූ ගැටළුවක් හේතුවෙන් සිදු වූවක් නොව පෘතුගීසීන්ගේ බල සංකේන්ද්‍රණයෙහි උසස් ම අවස්ථාව මගහැරීමේ අවශ්‍යතාවය මත සිදු වූවක් බව පෙනී යයි. විමලධර්මසූරිය විසින් ජයවීර බණ්ඩාර බෙදා වෙන්කොට පෘතුගීසී බලය පහත දැමූ පසු ආරක්ෂාව උදෙසා කොළඹ දක්වා පසු බසිමින් සිටි පෘතුගීසීන්ට දන්තුරේ දී පහර දෙන අවස්ථාවේ පෙරකී පෘතුගීසී බල සංකේන්ද්‍රණය සම්පූර්ණයෙන් ම බිඳ වැටී තිබුණි. අනෙක් අතට තමන් සතු ව සිටි හමුදාව සහ තම අවි බලය සුදුසු ම ස්ථානයේ දී අවශ්‍ය වේලාවට ගොණු කරගැනීමට විමලධර්මසූරිය රජු උපක්‍රමික වූ බැවින් බල සංකේන්ද්‍රණය අතින් කන්ද උඩරට පාර්ශ්වය සාර්ථක මට්ටමක පසු වූ බව දැක්විය හැකිය. මෙය තම පාර්ශ්වයෙහි බල සංකේන්ද්‍රණය පිළිබඳ ව පමණක් අවධානය යොමු කිරීමට වඩා ඉදිරියට ගොස් ප්‍රතිපාර්ශ්වයෙහි බල සංකේන්ද්‍රණය උපක්‍රමික ව මගහැරීම සහ ඔවුන්ගේ බල සංකේන්ද්‍රණය බිඳ වැටුණු විට පහර දීම දක්වා කන්ද උඩරට පාර්ශ්වය උපක්‍රමික ව දියුණු තත්වයක පසු වූ බව මෙයින් පෙනී යයි.


පෘතුගීසීන් සම්බන්ධයෙන් බලන කල ඔවුන් කන්ද උඩරට ආක්‍රමණයට එන අවස්ථාවේ දී බල සංකේන්ද්‍රණය මනාව පවත්වා ගන්නා ලදි. මන්ද ඔවුන් විසින් තමන්ගේ බලසේනාව වූ 1,200 ක සෙබළුන් සමගින් එකතු වූ ජයවීර බණ්ඩාරගේ 20,000 ක බලසේනාව මනාව හසුරුවමින් ප්‍රහාරය සඳහා පැමිණි බැවිනි. එහි දී පෘතුගීසී කපිතන් ජෙනරල්ගේ යුද දැනුම මත මෙහෙයවන ලද හමුදාව පෘතුගීසී අවි ආයුධ වලින් සන්නද්ධ ව ජයවීර බණ්ඩාරගේ මග පෙන්වීම ඔස්සේ පැමිණි බැවින් ඔවුන් බල සංකේන්ද්‍රණය අතින් ඉහළ මට්ටමක සිටි බව නිගමනය කළ හැකිය. නමුත් සෙංකඩගලට පැමිණි පසු විමලධර්මසූරියගේ කූට උපායට හසු ව ජයවීර බණ්ඩාරගේ සෙබළ පිරිස පෘතුගීසීන් හැරගිය බැවින් ඔවුන්ට සෙංකඩගලින් පසු බැස යෑමට සිදුවිය. මෙලෙස පසුබැස යන පෘතුගීසීන් වැඩි අවධානයක් යොමු කරන ලද්දේ කන්ද උඩරට අයිතිය වෙනුවෙන් තමන් වෙත තිබූ එකම සාධකය වූ කුසුමාසන දේවිය ආරක්ෂා කරගැනීම (Sri Lanka Military Academy, 2015: 19) කෙරෙහි ය. එබැවින් දන්තුරේ දී සිදු වූ බලාපොරොත්තු විරහිත ප්‍රහාරය අවස්ථාවේ දී ඔවුන්ගේ බල සංකේන්ද්‍රණය ඔවුන් වෙතින් ගිලිහී තිබූ බවක් දැකගත හැකිය.

- **<u>ප්‍රයත්නයේ සඵලතාවය.</u>**

මෙම යුද මූලධර්මයෙහි අදහස වන්නේ යුද හමුදාවක් විසින් තම ශක්තීන් තුලනාත්මක ව භාවිතා කිරීමේ අවශ්‍යතාවය යි (Ministry of Defense, 2001: 3-3). යුද්ධ හමුදාවක සටන් බලය තහවුරු කිරීම විෂයෙහි මෙය අත්‍යවශ්‍ය අංගයක් වන්නේ ය (Ministry of Defense, 2014: 31). අරමුණ සාක්ෂාත්කරණය සඳහා පිරිස් බලය, උපකරණ සහ කාලය ඥානවන්ත ව යොදවා ගැනීමක් මෙහි දී සිදුවේ (Sri Lanka Military Academy, 2015: 39).

විමලධර්මසූරිය රජු විසින් පෘතුගීසීන්ගේ විශාල හමුදාව සහ දියුණු අවි ආයුධ සමග තම පක්ෂය සමපාත කිරීමේ ගැටළුව හේතුවෙන් කාලය යන්න ඥානවන්ත ව යොදා ගනිමින් ක්‍රමයෙන් එකී අවාසිදායක තත්වයන් ද්විත්වය වාසිසහගත තත්වයක් දක්වා පරිවර්තනය කරගැනීමට සමත් විය. එය තම සම්පත් තුළනාත්මක ව භාවිත කිරීමක් වන්නේ ය. එසේ ම දන්තුරේ දී හානි අවම වන ආකාරයට තම බලය භාවිත කරමින් පිරිවැයට සාපේක්ෂ ව වැඩි ප්‍රතිඵලයක් ලබා ගැනීමට විමලධර්මසූරිය රජු සමත් විය. විමලධර්මසූරිය රජුගේ යුද සම්පත් භාවිතය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ඉහත දක්වන ලද පිරිස් බලය, උපකරණ සහ කාලය යන්නට අමතර ව යුද උපක්‍රම සහ සැපයුම් ආදිය ද විශ්ලේශනයට ලක් කිරීම වැදගත් බව පෙනී යයි. එකී යුද සම්පත් යොදා ගනිමින් මෙම විශ්ලේශනය ගොඩනැගීම ඔස්සේ විමලධර්මසූරිය රජුගේ යුද සම්පත් තුලනාත්මක ව භාවිත කිරීමක් සිදු වූ බව පැහැදිලි කරගත හැකි වන්නේ ය. මන් ද ඔහු විසින් උපක්‍රම මනාව යොදා ගැනීමත් තම හමුදාව පවත්වා ගැනීමට අවශ්‍ය වූ සරළ සැපයුම් ප්‍රමාණය අඛණ්ඩ ව පවත්වා ගැනීම තුළින් ඔහුගේ පාර්ශ්වය නිරන්තරයෙන් ම සටනට සූදානම් තත්වයකින් පවත්වා ගන්නා ලද බැවිනි.

පෘතුගීසීන් සම්බන්ධයෙන් තත්වය වෙනස් විය. පළමුවෙන් ම කපිතන් ජෙනරාල් සූසාගේ වැඩි විශ්වාසයක් පැවතියේ අවි ආයුධ සම්බන්ධයෙනි. කොළඹ සිටි පෘතුගීසී ප්‍රධානියා විසින් සේනා සැපයීම ප්‍රතික්ෂේප කළ අවස්ථාවේ (*රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය*, 2002: 83) පවා සටනට පිවිසීමට ඔහු යොමුවූයේ සුළු පිරිසක් වූ තම සේනාව පිළිබඳ තිබූ විශ්වාසය අබිභවා තම අවි බලය සම්බන්ධයෙන් තිබූ විශ්වාසය හේතුවෙන් බව පෙනේ. එබැවින් ආරම්භයේ සිට ම පෘතුගීසී නායකත්වය තුලනාත්මක සම්පත් භාවිතයක් පිළිබඳ ව නොසිතූ බව පෙනී යයි. ඔහු විසින් සිදු කළ තවත් මගහැරීමක් වන්නේ තම 1,200 ක හමුදාව සමග 20,000 ක දේශීය හමුදාවක් සම්බන්ධ කර ගැනීමයි. මෙහි දී ද ඔහු විශාල ප්‍රතිශතයකින් නොදන්නා පුද්ගලයෙකු මත යැපීමක් සිදු කර තිබේ. එබැවින් එම තීරණය ද තුලනාත්මක තත්වයක නොපවතින බව දක්නට ලැබේ. සෙංකඩගලට පැමිණි පෘතුගීසී හමුදාව ජයවීර බණ්ඩාරගේ 20,000 ක පිරිස වෙන් වී යෑම හේතුවෙන් පිරිස් බලයෙන් ද, ආහාර නොලැබීම හේතුවෙන් සැපයුම් අතින් ද බිඳ වැටුණි. එබැවින් සියලු ආකාර සම්පත් කෙරෙහි බලපෑම් ඇති වූ කළ පෘතුගීසී හමුදාව පසු බැසීමට තීරණය කළ ද ඒ වන විටත් තම සම්පත් මනාව පවත්වා ගත් විමලධර්මසූරිය රජුගේ ඥානවන්ත යුද භාවිතය ඉදිරියේ පෘතුගීසීන් පරාජයට ලක්විය.




4 රූපය - දන්තුරේ සටන් ව්‍යාපාරය තුළ කන්ද උඩරට සහ පෘතුගීසී පාර්ශ්වයන් හි යුද සම්පත්වල වෙනස්වීම.

- <u>**නම්‍යශීලීබව.**</u>

යුද්ධ හමුදාවක් සතුවිය යුතු ගුණාංග අතුරෙන් නම්‍යශීලීබව යන්න වැදගත් වන්නේ එක් එක් අවස්ථාවන්ට සාපේක්ෂ ව තම හැඩය වෙනස් කරගනිමින් යුද ශක්‍යතාවයන් පවත්වා ගැනීමේ අවශ්‍යතාවය හේතුවෙනි. එබැවින් යුද සෙබළා තමන්ට මුහුණ දීමට සිදුවන වෙනස්වන සුළු පරිසරයට හැඩගැසෙමින් තම බලය පවත්වා ගැනීමට සමත්වීම අත්‍යවශ්‍ය වන්නේ ය (Phillips, 1983). මෙය උපක්‍රමික නම්‍යශීලීභාවයක් වශයෙන් ලෝක ඉතිහාසයේ යුද්ධ වල දී පවා විවිධාකාරයෙන් දකගත හැකි තත්වයකි (The military revolution: Tactical Flexibility, n.d.). එසේ ම ලෝක ඉතිහාසයේ පැවති යුද්ධයන් හි අවස්ථාවෝචිත ව සිදු කරන ලද නම්‍යශීලී ක්‍රියාවන් හි ප්‍රතිඵලයක් වශයෙන් නව උපක්‍රම සහ නව යුද සැලසුම් ක්‍රම ලෝකයට බිහි වූ බව ද මෙහිලා පැහැදිලි කරගත හැකිය. මේ අනුව පෙනී යන්නේ නම්‍යශීලීබව යන්න බොහෝ විට උපක්‍රමික ප්‍රායෝගිකතාවයේ අංගයක් වශයෙන් පවතින බවයි.

මෙකී තත්වය දන්තුරේ සටන සමග සම්බන්ධ කොට විශ්ලේශනය කිරීමේ දී කන්ද උඩරට පාර්ශ්වය ප්‍රායෝගික තත්ව මත කොතෙක් දුරට නම්‍යශීලීවූවේ ද යන්න අධ්‍යයනය කිරීම වැදගත් වේ. මූලික ව සතුරු පාර්ශ්වයෙහි යුද ශක්තිය හේතුවෙන් සතුරු හමුදාවට මුහුණ දීම වෙනුවට ඔවුන් උපක්‍රමික ව මගහැරීමට තීරණය කිරීම විමලධර්මසූරිය රජු විසින් නම්‍යශීලීබව පෙන්වූ පළමු අවස්ථාව වන්නේ ය. තව ද, තමන්ගේ රාජධානියේ අගනුවර වූ සෙංකඩගල නගරය සහ තම මාලිගය පවා සතුරා අතට පත්වීමට ඉඩ දී ඉන් ඉවත් වී අවස්ථාවෝචිත ව තම සැලසුම් වෙනස් කරගැනීමට කටයුතු කළ බැවින් දන්තුරේ සටන් ව්‍යාපාරය තුළ උපරිම නම්‍යශීලීබවක් ප්‍රදර්ශනය කළ පාර්ශ්වය වශයෙන් කන්ද උඩරට පාර්ශ්වය දැක්විය හැකිය.

පෘතුගීසීන් සම්බන්ධයෙන් තත්වය මීට හාත්පස වෙනස් විය. දන්තුරේ සටන් ව්‍යාපාරය ආරම්භයේ සිට පෘතුගීසීන්ගේ නම්‍යශීලීබව සම්බන්ධයෙන් ගැටළු මතුවිය. ගෝවේ සිට කපිතන් ජෙනරාල්වරයා සමග පැමිණි නැව් කිහිපයක් විනාශ වීමෙන් සැපයුම් ද්‍රව්‍ය විනාශ වී තිබිය දී සහ කොළඹ ප්‍රධානියා විසින් ඔහුට අවි සහ පිරිස සැපයීම ප්‍රතික්ෂේප කර තිබිය දී ත් කපිතන් ජෙනරල්වරයා තීරණය කරන ලද්දේ කන්ද උඩරට ආක්‍රමණය කිරීමට ය. එය ඔවුන් වෙත තිබූ අධිතක්සේරුව ප්‍රදර්ශනය කරන ලද අවස්ථාවක් වූ අතර නම්‍යශීලීබව උපක්‍රමික ව යොදා නොගැනීම සම්බන්ධයෙන් වූ සැබෑ උදාහරණයකි. මෙය රෝම ඉතිහාසඥ සූටෝනියස් ඉදිරිපත් කරන යුද්ධ සම්බන්ධ රුබිකන් න්‍යාය සමග ඍජු ව සම්බන්ධ වේ. ඉන් කියැවෙන්නේ යුද්ධයක් සඳහා තම සෙනට් සභාවේ අනුමැතියෙන් තොරව පිට ව ගිය ජුලියස් සීසර් රුබිකන් නදී තෙරේ දී ''නැවත හැරී යෑමට නොහැකි තත්වයකට'' පත් ව සිටීම සම්බන්ධයෙනි (Dominic & Dominic, 2011: 7-40). ගෝවේ සිට සියලු ආකාර යුද සම්පත් සමගින් ශ්‍රී ලංකාවට පැමිණි කපිතන් ජෙනරාල් පේරෝ ලෝපේස් ද සූසා ද බොහෝ සාධක හේතුවෙන් ශ්‍රී ලංකාවට පැමිණි මුල් අවස්ථාවේ දී ම ''නැවත හැරී යෑමට නොහැකි තත්වයකට'' පත් ව සිටි බවක් පෙනේ.

රුබිකන් න්‍යායෙහි පැහැදිලි කරන ආකාරයට ක්‍රියාත්මකවීමේ මානසිකත්වයක් සහිත නායකයින් තමන් පිළිබඳ ව අධි තක්සේරුවකින් පසුවන අතර ඔවුන්ගේ සැලසුම් වැඩි අවදානම් සහගත බවකින් යුක්ත වන්නේ ය. පෘතුගීසී කපිතන් ජෙනරාල්වරයා මෙකී තත්වය නියෝජනය කරන ලද්දෙකු බව පැහැදිලි වන්නේ ඔහු විසින් කන්ද උඩරට ආක්‍රමණය සඳහා තෝරාගත් කාලය වූ සැප්තැම්බර් - ඔක්තෝබර් කාලය මෝසම් වර්ෂාවෙන් බාධාවන කාලයක් වූ බැවිනි (Sri Lanka Military Academy, 2015: 13). මෝසම් වර්ෂාව හේතුවෙන් පෘතුගීසී හමුදාවෙහි ගමන අතිශය දුෂ්කර වූ අතර එමගින් ඔවුන්ගේ සටන් කිරීමේ හැකියාවට බලපෑම් ඇති කරන ලදි. තත්වය එසේ වුව ද පේරෝ ලෝපේස් ද සූසා තම ගමන කිසි ලෙසකින් වෙනසකට ලක් කිරීමට කටයුතු නොකරන ලදි. මේ අනුව පැහැදිලි වන්නේ පෘතුගීසී පාර්ශ්වය දන්තුරේ සටන් ව්‍යාපාරය පුරාවට ම අනම්‍ය ප්‍රතිපත්තියක හිඳ කටයුතු කරන ලද බවයි. සෙංකඩගල රාජ්‍යය අත්පත් කරගැනීමෙන් පසු ජයවීර බණ්ඩාරගේ වෙන් ව යෑමෙන් සහ ජනතා සහය නොලැබීමෙන් පසු කන්ද උඩරට අත්හැර යෑමට තීරණය කිරීම නම්‍යශීලීබවට අදාළ කරගත නොහැකි වන්නේ එය සැබෑ උපක්‍රමික භාවිතයක් නොව පරාජිත තත්වයක් තුළ සිදු වූ පසුබැසීමක් වූ බැවිනි.

- **ආරක්ෂාව.**

යුද මූලධර්මයක් වශයෙන් සැලකීමේ දී ආරක්ෂාව යන්නෙන් දක්වන සංකල්පමය අදහස වන්නේ තෝරාගත් ඉලක්කය වෙනුවෙන් ප්‍රහාර එල්ල කිරීම සඳහා අත්‍යවශ්‍ය වන නිදහස සලසා ගැනීමකි (Doctrine Cell, 2012: 38). ආරක්ෂාව සඳහා නිර්හීත ක්‍රියාවලියක් අවශ්‍ය වුව ද එමගින් සියලු ආකාර අවදානම් නොසලකා හැරීමක් හෝ අනවශ්‍ය සැලකිලිමත්බවක් අදහස් නොකෙරේ. ආරක්ෂාව සැලසීමේ දී අරමුණු සාක්ෂාත් කරගැනීම සහ ඒ වෙනුවන් සිදුවන ආලාභ යන අංශ ද්විත්වය පිළිබඳ තුලනාත්මක දෘෂ්ටියකින් බැලීමේ හැකියාවක් පැවතිය යුතුය (Ministry of Defense, 2014: 30).

මේ අනුව ආරක්ෂාව නම් යුද මූලධර්මය දන්තුරේ සටන් ව්‍යාපාරය තුළ දී කොතෙක් දුරට භාවිත වූයේ ද යන්න විමසා බැලීමේ දී කන්ද උඩරට පාර්ශ්වයෙහි ක්‍රියාකාරීත්වය මුලින් අවධානයට යොමු කිරීම වැදගත් වේ. තමන්ගේ සතුරු පාර්ශ්වය වූ පෘතුගීසීන් යුද දැනුම අතින් සහ ප්‍රායෝගික අත්දැකීම් අතින් දියුණු මට්ටමක පසුවීමත්, ජයවීර බණ්ඩාරගේ 20,000 ක හමුදාවක් ඔවුන් හා සම්බන්ධවීමෙන් පිරිස් බලය මෙන් ම දේශීය භූමිය පිළිබඳ ව මගපෙන්වීම පහසුවීමත්, හේතුවෙන් ඔවුන් යුදමය අතින් ශක්තිමත් තත්වයක සිට තමන් වෙතට ගමන් කරන බව විමලධර්මසූරිය රජු වටහා ගත්තේ ය. එකී අවදානම සලකා බලා තමන් විසින් අනුගමනය කළ යුතු ආරක්ෂක ක්‍රියාමාර්ගයන් ඔහු විශ්ලේෂනය කළ බව පෙනේ. සන් සූ දක්වන්නේ ''ඔහු හැම අතින් ම ආරක්ෂිත නම් ඔහු වෙනුවෙන් සූදානම් වෙන්න. ඔහු උපරිම ශක්තියකින් යුක්ත නම් ඔහුව මගහරින්න.'' (*Art of War by Sun Tzu*, 1910) යනුවෙනි. සන් සූ ගේ යුද කලාව පිළිබඳ ව අවබෝධයකින් නොවුව ද යුද්ධයන් හි දී උපක්‍රමික භාවිතය පිළිබඳ ව ඇතිවන පොදු සංජානනය අනුව විමලධර්මසූරිය රජු ද ඉහත කී උපක්‍රමයන් භාවිත කළ බව පෙනේ.


මෙම අවස්ථාවේ දී විමලධර්මසූරිය රජු විසින් තම අගනුවර සහ රාජකීය සම්පත් ආරක්ෂා කරගැනීම අරමුණු කරගත්තේ නම් පෘතුගීසී හමුදාවට මුහුණ දී ඔවුන් පරාජය කිරීමට උත්සහ ගත යුතු විය. නමුත් එහි දී ඔවුන් අතින් පරාජයට පත්වුවහොත් තමන්ට සිදුවන අහිමිවීම වන්නේ තමන්ගේ ජීවිතය සහ රාජ්‍යත්වයයි. එබැවින් විමලධර්මසූරිය රජුගේ තේරීම වූයේ තමන්ගේ ජීවිතය සහ රාජ්‍යත්වය වෙනුවෙන් තම අගනුවර සහ රාජකීය සම්පත් අහිමිවීමට ඉඩ හැරීමයි. එමගින් ඔහු තම ජීවිතය, රාජ්‍යත්වය සහ සේනාව පවා රැකගනිමින් ප්‍රහාරාත්මක බව පවත්වා ගැනීමට අවශ්‍ය නිදහස ඇති කරගත්තේ ය.

පෘතුගීසීන්ගේ පාර්ශවයෙන් බැලීමේ දී කපිතන් ජෙනරාල්ගේ හැසිරීමෙන් පැහැදිලි වන්නේ සියලු ආකාර අවදානම් නොසලකා හරිමින් කටයුතු කළ බවයි. මන්ද, ආරම්භක අවස්ථාවේදී කොළඹ ප්‍රධානීන්ගේ සහය නොලැබුණ ද සුළු හමුදාවක් සමග සටනට යෑමට සූදානම් වීමත්, දේශගුණික තත්වයන් පිළිබඳ නොදැනුවත්කම හේතුවෙන් මෝසම් වර්ෂාවෙන් දැඩි බාධා එල්ල වුව ද එය නොසලකා කටයුතු කිරීමත්, රණ ශූරයෙක් වූ සීතාවක රාජසිංහ රජුට පවා පසුකර යෑමට නොහැකි වූ බලන කොටුව සුළු බාධක පමණක් යොදා පහසුවෙන් පසුකර යෑමට ඉඩ සැලසූ කන්ද උඩරටින්ගේ උපක්‍රමය අවබෝධ කර නොගැනීමත්, කුසුමාසන දේවිය නම් වූ පෘතුගීසීන් සතු වූ ඉහළ ම වගකීම රැගෙන කන්ද උඩරටට ගමන් කිරීමත්, පිරිස් බලය අතින් විශාල ප්‍රතිශතයකින්

ජයවීර බණ්ඩාරගේ දේශීය හමුදාවන් මත යැපීමත්, යන කාරණාවන් විශ්ලේශනය කිරීමේ දී පෘතුගීසී නායක පේරෝ ලෝපේස් ද සූසා විසින් සියලු ආකාර අවදානම් නොසලකා හරිමින් කන්ද උඩරට දක්වා විවෘත වූ ත්, ඍජු වූ ත්, ගමනක යෙදුණ බව පැහැදිලි වෙයි. ඒ අනුව ආරක්ෂාව නමින් හැඳින්වෙන යුද මූලධර්මයට මුළුමනින් ම පටහැනි හැසිරීමක් පෘතුගීසීන් විසින් ප්‍රදර්ශනය කළ බව නිගමනය කළ හැකිය.

අවදානම් නොසලකාහැරීමේ සහ ඒවා අවබෝධ කර නොගැනීමේ අවසන් ප්‍රතිඵලය වූයේ කුසුමාසන දේවිය නම් ඉහළ ම වගකීම අවදානමට ලක්වීම සහ තමන් උපරිම වශයෙන් යැපෙමින් සිටි ජයවීර බණ්ඩාරගේ හමුදාවන් ඉවත්වීමෙන් තමන්ගේ අරමුණ පමණක් නොව ජීවිත ද අවදානමට ලක්වීමයි. එබැවින් තමන් විසින් සාක්ෂාත් කරගන්නා ලදැයි සිතාසිටි අරමුණ පවා වැය කොට ජීවිත ආරක්ෂාව උදෙසා පසුබැසීමට පෘතුගීසීන්ට සිදුවිය. මේ අවස්ථාවේ දී ප්‍රහාරයක් එල්ල වීමේ දී ජීවිත ආරක්ෂාවීමක් විනා සතුරා වෙත තම ප්‍රහාරාත්මකබව පවත්වා ගැනීම වෙනුවෙන් ආරක්ෂාව යන්න යොදා ගැනීමට ඔවුන්ට හැකියාවක් නොවීය.

කන්ද උඩරට පාර්ශ්වයෙන් සහ පෘතුගීසී පාර්ශ්වයෙන් ආරක්ෂාව, ප්‍රහාරාත්මක බව සහ අවදානම යන්න කළමණාකරණය කරගත් ආකාරය පහත රූපසටහනෙන් සන්සන්දනය කෙරේ.





5 රූපය - දන්තුරේ සටන් ව්‍යාපාරය තුළ කන්ද උඩරට සහ පෘතුගීසී පාර්ශ්වයන් හි ආරක්ෂාව.

- **<u>සහයෝගය.</u>**

යුද්ධයක දී සාර්ථක ව අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අදාළ පාර්ශවයන් ඒකාබද්ධ ව කටයුතු කිරීම වැදගත් වේ (Indian Army, 2004: 24). සහයෝගය යන්න කණ්ඩායම් හැඟීම මත රඳා පවතින අතර එය එක් ආකාරයක අන්තර් යැපීමේ ක්‍රියාවලියක් නිර්මාණය කරයි. එමගින් තනි තනි ව දරණ ශක්තියට වඩා වැඩි ඒකාබද්ධ ශක්තියක් ජනිත කිරීම විශේෂත්වයක් වන්නේ ය. (Doctrine Cell, 2012: 40).

දන්තුරේ සටන් ව්‍යාපාරය තුළ කන්ද උඩරට පාර්ශ්වය විසින් තම හමුදාවෙහි සහයෝගය බිඳ වැටීමට ඉඩ සැලැස්වීමක් නොකළ අතර මුල් අවස්ථාවේ දී ම පෘතුගීසීන් මගහැර යෑම තුළින් තම හමුදාවන්ට හානි සිදුවීම වළක්වා ගනිමින් සියලු පාර්ශ්වයන් හි අන්තර් ක්‍රියාකාරීත්වයන් පළුදු වීම වළක්වා ගන්නා ලදි. භෞතික යුද තත්වයකට මුහුණ දී සිටින අවස්ථාවකට සාපේක්ෂ ව සැඟවී සිට සතුරාට නොදැනී සතුරා සමග සම්බන්ධ වී ඔහුගේ දුර්වලතාවයන් ඔස්සේ ප්‍රහාර එල්ල කිරීමකට සැලසුම් කළ හමුදාවක් හැටියට කන්ද උඩරට හමුදාව තම පාර්ශ්වය තුළ සහයෝගය යන්න ඉහළ මට්ටමකින් පවත්වා ගත් බව මනාව පෙනී යයි. අනෙක් අතට කන්ද උඩරට හමුදාව තමන් තුළ පමණක් නොව කන්ද උඩරට ජනතාව සමගින් ද මනා සහයෝගයකින් කටයුතු කරමින් සැඟවී සිටීම, ආහාර පාන සපයා ගැනීම, සතුරා සම්බන්ධ තොරතුරු රැස්කිරීම සහ උපක්‍රමික ව සතුරා බිඳ දැමීම ආදී කටයුතු සඳහා ජනතා සහයෝගය ද මනාව උපයෝගී කරගන්නා ලදි. කන්ද උඩරට ජනතාව සහ හමුදාව අතර තිබූ සහයෝගය මනාව පිළිබිඹු කරන්නේ කන්ද උඩරටට උරුමය ඇති කුසුමාසන දේවිය රැගෙන පැමිණිය ද පෘතුගීසීන්ට ජනතා සහය නොලැබුණු බැවිනි.

පෘතුගීසීන් සම්බන්ධයෙන් බැලීමේ දී ඔවුන් තුළ ආරම්භක අවස්ථාවේ දී සහයෝගයෙන් යුත් ක්‍රියාකාරීත්වයක් දෘෂ්‍යමාන වුව ද සෙංකඩගලට පැමිණීමෙන් පසු එය දරුණු ලෙස බිඳ වැටුණු බව දක්නට ලැබේ. පෘතුගීසීන්ගේ අභ්‍යන්තර සහයෝගය පවත්වා ගැනීමට සිටි හමුදාව බෙදී වෙන් වී ජයවීර බණ්ඩාරගේ පාර්ශවය ඉන් ඉවත් විය. එපමණක් ද නොව, විශාල අවදානමක් ගෙන කන්ද උඩරටට රැගෙන පැමිණි කුසුමාසන දේවියට ජනතා සහයෝගය නොලැබී යෑමෙන් බාහිර සහයෝගය ද බිඳ වැටුණි. මෙකී තත්වය තුළ කන්ද උඩරට හමුදාවට එරෙහි ව සටන් කිරීම හෝ තව දුරටත් කන්ද උඩරට රැඳී සිටීම හෝ කළ නොහැකි වූ බැවින් පෘතුගීසීන් පසු බැසීමට තීරණය කළ බව පැහැදිලි වේ. මෙම සටන් ව්‍යාපාරයේ දී සටන් පාරශ්වයන් වෙත පැවති සහයෝගය පහත රූප සටහනින් පැහැදිලි කෙරේ.




6 රූපය - දන්තුරේ සටන් ව්‍යාපාරය තුළ කන්ද උඩරට සහ පෘතුගීසී පාර්ශ්වයන් හි සහයෝගය.

- **<u>පරිපාලනය.</u>**

මනා පරිපාලනය යන්න ඕනෑම මෙහෙයුමක් සාර්ථක කරගනු වස් පූර්ව අවශ්‍යතාවයක් වන්නේ ය (The Horton Academy, 2016: 18). සාමාන්‍යයෙන් පරිපාලනය යන්නෙන් අදහස් වන්නේ සැලසුමක් ක්‍රියාත්මක කිරීම පාලනය කිරීම සඳහා විධිවිධාන සහ කාර්යයන් හැසිරවීම යන්නයි (Administration, n.d.). පරිපාලනයේ දී විශේෂ අවධානය යොමු කළ යුතු අංශයක් වන්නේ හිඟ සම්පත් උපරිම උපයෝගීතාවයක් දක්වා මෙහෙයවීමයි (The Horton Academy, 2016: 18). යුද අවස්ථාවක දී භෞතික සම්පත්, මානව සම්පත් සහ සහායක සේවාවන් කාර්යක්ෂම ව හසුරුවමින් අරමුණ කරා තම පාර්ශ්වය මෙහෙයවීම පරිපාලනය යන්නෙන් අදහස් වන බව පැහැදිලි වෙයි. පරිපාලන ක්‍රියාවලියෙහි පැවතිය යුතු තවත් වැදගත් ලක්ෂණයක් වන්නේ අවශ්‍යතාවය අනුව වෙනස්කම් සිදු කරමින් අරමුණ සාක්ෂාත් කරගැනීමට දිශාගත වීමයි.

විමලධර්මසූරිය රජු විසින් මෙම සටන් ව්‍යාපාරය තුළ තම සම්පත් සහ සහායක සේවාවන් ආරක්ෂිත ව සහ සැලසුම් සහගත ව හැසිරවීමට සමත් වූ බව පෙනේ. එබැවින් තමන්ගේ පාර්ශ්වයට හානි අවම වන ආකාරයට සාර්ථක ව අරමුණ ජයගැනීමට ඔහුට හැකි විය. ඒ අනුව පැහැදිලි වන්නේ කන්ද උඩරට පාර්ශවය විසින් සාර්ථක පරිපාලන ක්‍රියාවලියක් අනුගමනය කළ බවයි.

පෘතුගීසී පාර්ශ්වය සම්බන්ධයෙන් සැලකීමේ දී ඔවුන් පරිපාලන කාර්යයන් අතින් දුර්වල මට්ටමක පසුවූයේ යැයි තර්ක කිරීම උගහට ය. මන්ද, ඒ වන විටත් ඔවුන් ආසියාවේ රාජ්‍යයන් පවා යටත් කරගත් ප්‍රථම බටහිර ජාතිය බවට පත් ව සිටි බැවින් ඔවුන්ගේ රාජ්‍ය පරිපාලනය මෙන් ම යුද පරිපාලනය ද ඉහළ මට්ටමක තිබූ බැවිනි. දන්තුරේ සටන් ව්‍යාපාරය ආරම්භයේ දී ද ඔවුන්ගේ පරිපාලන හැකියාව ප්‍රදර්ශනය විය. යුද්ධයට අවශ්‍ය මානව සහ භෞතික සම්පත් මෙන් ම යුද්ධ ජයග්‍රහණය සඳහා උපකාරී වන කන්ද උඩරට සැබෑ උරුමක්කාරිය ද යොදා ගනිමින් ඔවුන් සාර්ථක යුද සැලසුමකට අදාළ පරිපාලන කටයුතු ආරම්භ කළ බව දක්නට ලැබේ. නමුත් තම සම්පත් උපක්‍රමික ව මෙහෙයවීම, අවස්ථාවෝචිත ව නම්‍යශීලී වීම, අවශ්‍ය කාර්යයන් අවශ්‍ය විට සිදු කිරීම ආදී වූ සාධකයන් අතින් අසාර්ථක වීම හේතුවෙන් දන්තුරේ සටන් ව්‍යාපාරය තුළ අත්‍යවශ්‍ය අවස්ථාවේ දී පෘතුගීසී පාර්ශ්වයේ පරිපාලනය දුර්වල මට්ටමක් දක්වා ඇද වැටුණු බව පෙනී යයි.

**සටන් විශ්ලේශනයේ සමාලෝචනය**

මේ අනුව දන්තුරේ සටන් ව්‍යාපාරය යුද මූලධර්මයන් නම් වූ පසුකාලීන ව සංවර්ධනය වූ සංකල්පමය පදනම මත හිඳ විග්‍රහ කරන කල්හි කන්ද උඩරට 1 වැනි විමලධර්මසූරිය රජුගේ පාර්ශ්වයේ සහ පෘතුගීසී කපිතන් ජෙනරාල් පේරෝ ලෝපේස් ද සූසාගේ පාර්ශ්වයේ හැසිරීම එක් එක් යුද මූලධර්මයන් අනුව පහත ආකාරයට ප්‍රමාණකරණයකට ගොණු කළ හැකි ය.

**ප්‍රමාණකරණ යතුර -**

| සාර්ථකත්වය | වර්ණය | දර්ශකය |
|---|---|---|
| උපරිම සාර්ථක | | 4 |
| සාර්ථක | | 3 |
| මධ්‍යස්ථ | | 2 |
| අසාර්ථක | | 1 |
| උපරිම අසාර්ථක | | 0 |

| යුද මූලධර්මය | ප්‍රමාණකරණ වර්ණය | | ප්‍රමාණකරණ දර්ශකය | |
|---|---|---|---|---|
| | කන්ද උඩරට පාර්ශ්වයෙහි සාර්ථකත්වය | පෘතුගීසි පාර්ශ්වයෙහි සාර්ථකත්වය | කන්ද උඩරට පාර්ශ්වයෙහි දර්ශකය | පෘතුගීසි පාර්ශ්වයෙහි දර්ශකය |
| අරමුණ තෝරා ගැනීම සහ පවත්වා ගැනීම | | | 3 | 0 |
| චිත්ත ධෛර්‍යය පවත්වා ගැනීම | | | 3 | 1 |
| ප්‍රහාරාත්මක ක්‍රියාව | | | 4 | 1 |
| විශ්මය | | | 4 | 0 |
| බලසංකේන්ද්‍රණය | | | 3 | 0 |
| ප්‍රයත්නයේ සඵලතාවය | | | 4 | 0 |
| නම්‍යශීලීබව | | | 4 | 0 |
| ආරක්ෂාව | | | 4 | 1 |
| සහයෝගය | | | 4 | 0 |
| පරිපාලනය | | | 3 | 2 |
| සන්සන්දනාතමක සාර්ථකත්වයෙහි ප්‍රමාණය | | | 36/40 | 5/40 |
| ප්‍රතිශතයක් වශයෙන් සාර්ථකත්වය | | | 90% | 12.5% |

1 වගුව - දන්තුරේ සටන් ව්‍යාපාරය තුළ කන්ද උඩරට සහ පෘතුගීසී සාර්ථකත්වය.

ඉහත විශ්ලේශනයෙන් පැහැදිලි වන්නේ දන්තුරේ සටන් ව්‍යාපාරය තුළ කන්ද උඩරට හමුදාව පෘතුගීසීන්ට සාපේක්ෂ ව වැඩි වාසියක් අත්පත් කරගත් බවයි. වත්මන් යුද මූලධර්මයන් ඔස්සේ විශ්ලේශනය කිරීමේ දී එකී සෑම මූලධර්මයක දී ම පෘතුගීසී පාර්ශ්වයට වඩා පැහැදිලි සාර්ථකත්වයක් පවත්වා ගැනීමට කන්ද උඩරට හමුදාව සමත් වූ බව පෙනේ. ඉහත විශ්ලේශනය කරන ලද වත්මන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව භාවිත කරන දසවැදෑරුම් යුද මූලධර්මයන්ට අනුව බැලීමේ දී වුව ද කන්ද උඩරට හමුදාවේ සාර්ථකත්වය මනාව ප්‍රදර්ශනය වන නමුත් එකී යුද මූලධර්මයන්ට ඔබ්බෙහි ඇති දේශීය අනන්‍යතාවයෙන් යුතු යුද මූලධර්මයන් කිහිපයක් දන්තුරේ සටන් ව්‍යාපාරය විශ්ලේශනය මගින් අනාවරණය කරගත හැකි ය. දේශීය අනන්‍යතාවය සහිත යුද මූලධර්මයන් සඳහා ශ්‍රී ලංකාවේ යුද ඉතිහාසයෙහි ප්‍රායෝගික තත්වයන් සහ ශ්‍රී ලංකාවේ ආර්ථිකය, දේශපාලනය, භූමිය, හමුදාවෙහි ශක්‍යතාවයන් ආදී විවිධ වූ කාරණාවන් හේතු වූවා විය හැකිය. එබැවින් දන්තුරේ සටන් ව්‍යාපාරය විශ්ලේශනය කරනු වස් පහත විස්තර කරන දේශීය අනන්‍යතාවයකින් යුක්ත යුද මූලධර්මයන් ද භාවිත කළ හොත් ඉහත ගණනය කරන ලද සන්සන්දනාත්මක අගයන් වෙනස් වෙමින් කන්ද උඩරට පාර්ශ්වයෙහි සාර්ථකත්වය තව දුරටත් ඉහළ නැංවෙනු ඇත.

## අනාවරණය කරගන්නා ලද දේශීය පාරම්පරික යුද ඥානය

දන්තුරේ සටන් ව්‍යාපාරය විශ්ලේශනය කිරීමෙන් අනාවරණය කරගන්නා ලද දේශීය අනන්‍යතාවයකින් යුතු යුද මූලධර්මයන් ත්‍රිත්වයක් පහත පරිදි විග්‍රහ කර දක්විය හැකිය.

- <u>අවබෝධය</u>

යුද මූලධර්මයක් වශයෙන් අවබෝධය යන්න ඕනෑම හමුදාවකට අත්‍යවශ්‍ය යුද පහසුකරණ සාධකයක් වන්නේ ය. අවබෝධය යන්නෙන් මූලික වශයෙන් අදහස් වන්නේ අභ්‍යන්තර සහ බාහිර චලනයන් සම්බන්ධයෙන් තමන් තුළ පවතින සංජානනය යි. මෙය මූලික වශයෙන් කොටස් 4 ක් යටතේ විග්‍රහ කළ හැකිය.

1. හමුදාමය අවබෝධය - මේ යටතේ බුද්ධ තොරතුරු ඔස්සේ ගොඩනැගෙන සතුරා පිළිබඳ අවබෝධය, තමන්ගේ හමුදාව පිළිබඳ වන සැබෑ අවබෝධය, භූමිය පිළිබඳ අවබෝධය, උපක්‍රමික අවස්ථාවන් පිළිබඳ අවබෝධය, යුද ඉතිහාසය සහ ප්‍රතිඵල පිළිබඳ අවබෝධය ආදිය ගැනේ.

2. සමාජයීය අවබෝධය - යුද්ධයක් සම්බන්ධයෙන් සමාජයේ පවතින ඉල්ලුම සම්බන්ධ අවබෝධය, යුද අවස්ථාවේ දී සමාජ සහයෝගය පිළිබඳ අවබෝධය, යුද්ධයකින් සමාජයට විය හැකි හානිය පිළිබඳ අවබෝධය ආදිය මීට අදාළ වේ.

3. ආර්ථිකමය අවබෝධය - යුදමය තත්වයක් සඳහා තම ආර්ථිකයෙන් ලබාදිය හැකි දායකත්වය පිළිබඳ අවබෝධය, යුද්ධයකින් තම පාර්ශ්වයෙහි ආර්ථිකයට විය හැකි හානිය පිළිබඳ අවබෝධය, ආර්ථික හැකියාව මත තම හමුදාවට අත්පත් කරගත හැකි උපරිම ශක්තියෙහි ප්‍රමාණය පිළිබඳ අවබෝධය ආදිය මේ යටතේ ගැනේ.

4. දේශපාලනමය අවබෝධය - යුද්ධයෙහි දේශපාලනික අරමුණ පිළිබඳ අවබෝධය, දේශපාලනික අරමුණ වෙනුවෙන් සටන සහ සාකච්ඡාව යන දෙආකාරයෙන් සුදුසු ම ක්‍රමවේදය පිළිබඳ අවබෝධය ආදිය මීට අයත් වේ.


මේ අනුව පැහැදිලි වන්නේ යුද මූලධර්මයක් වශයෙන් අවබෝධය යන්න හමුදාමය අවබෝධයෙන් ඔබ්බට දිවයන පුළුල් ආකාරයේ අවබෝධයක් සම්බන්ධයෙන් සඳහන් වන්නක් බවයි. හමුදාමය, සමාජයීය, ආර්ථිකමය, දේශපාලනමය යන සිව් ආකාර අවබෝධයන් මනා වූ යුද සැලසුමකට සහ ක්‍රියාකාරීත්වයකට මගපාදනු ලබයි. මෙය පහත රූප සටහනින් පැහැදිලි කෙරේ.




7 රූපය - යෝජිත යුද මූලධර්මය 1 - අවබෝධය

- **<u>අනන්‍ය සැලසුම්</u>**

සෑම හමුදාවක් විසින් ම තමන්ට අනන්‍ය වූ සැලසුම් සාර්ථක ව පවත්වා ගන්නේ නම් එය යුද ජයග්‍රහණයක් සඳහා මහත් රුකුලක් වන ඇත. සාර්ථක යුද සැලසුම් සකස් කිරීම සඳහා ඉහත විග්‍රහ කරන ලද අවබෝධය යන්න අත්‍යවශ්‍ය සාධකයක් වන අතර සාර්ථක සැලසුම් සෑම විට ම යුදමය දෘෂ්ටිකෝණයකට පමණක් සීමා වූවක් නොවේ. ඒ සඳහා ත්‍රිවිධාකාර වූ දෘෂ්ටියක් අවශ්‍ය වන අතර පහත රූපසටහනින් එය සම්පිණ්ඩනය කර දක්වයි.




8 රූපය - යෝජිත යුද මූලධර්මය 2 - අනන්‍ය සැලසුම්

1. හමුදාමය දෘෂ්ටිය - මෙහිදී තම පාර්ශ්වයෙහි සහ සතුරු පාර්ශ්වයෙහි පිරිස් බලය, අවි බලය, පුහුණුව, ආදිය පිළිබඳ ව සන්සන්දනාත්මක දෘෂ්ටියක් පවත්වා ගත යුතුය.

2. භූගෝලීය දෘෂ්ටිය - සටන් සඳහා සූදානම් වන භූමියේ සහ ඒ ආශ්‍රිත භූමියේ භූ විශමතාවය සහ එහි සුවිශේෂී තත්වයන්, කාලගුණික සහ දේශගුණික තත්වයන්, ජන ව්‍යාප්තිය සහ විශේෂිත සමාජ විචලන තත්වයන්, විශේෂිත හෝ ක්ෂණික ව සිදුවිය හැකි වෙනස්වීම් තත්වයන් ආදිය පිළිබඳ ව වන දෘෂ්ටියක් පවත්වා ගත යුතුය.

3. බාහිර දෘෂ්ටිය - සමාජයීය අවශ්‍යතාවය හා බද්ධවීම, ආර්ථික තත්වයන් හා බද්ධවීම, දේශපාලනික අරමුණ හා බද්ධවීම, අන්තර්ජාතික පිළිගැනීම හා බද්ධවීම ආදිය සම්බන්ධයෙන් වූ දෘෂ්ටියක් පවත්වා ගත යුතුය.

මෙකී ත්‍රිවිධාකාර දෘෂ්ටීන් හි අවසන් ප්‍රතිඵලය වශයෙන් සාර්ථක සැලසුම් නිර්මාණය කරගැනීමට හැකි වන අතර ඒවා තම පාර්ශ්වයෙහි සූදානම උපරිම වශයෙන් පවත්වා ගැනීම සඳහා වූ ගාමක බලවේගය වනු ඇත.

- **සූදානම**

සූදානම යනු යුද හමුදාවක ජීවය බඳු සංකල්පයකි. එබැවින් යුද මූලධර්මයක් වශයෙන් සූදානම යන්න අනුගමනය කිරීමෙන් හමුදාවක ආරක්ෂාව මෙන් ම ප්‍රහාරාත්මක හැකියාව ද ඉහළ තලයක් දක්වා ඔසවා තබනු හැකි වේ. මනා සූදානමක් පවත්වා ගැනීමට නම් පුළුල් අවබෝධයක් ඔස්සේ නිර්මාණය වූ ඕනෑම තත්වයක් සම්බන්ධයෙන් විශ්ලේශනය කරන ලද සාර්ථක සැලසුම් පැවතීම අත්‍යාවශ්‍ය වන්නේ ය. සූදානම යන්න සතුරාට මුහුණදීමට හෝ උපක්‍රමික ව සතුරා මගහැරීමට හෝ වන සූදානමක් විය හැකිය. කෙසේ වුව ද එය මනා අවබෝධයක් ඔස්සේ සාර්ථක සැලසුම්

වලට අනුව සිදුවන්නක් විය යුතු ය. යුද මූලධර්මයක් වශයෙන් සූදානම යන්න මූලික ප්‍රභවයන් ද්විත්වයක් ඔස්සේ ජනිත වන්නක් වේ. ඒවා නම්,

1. භෞතික සූදානම - හමුදාවක භෞතික සූදානම පවත්වා ගැනීම විෂයෙහි සැලසුම්, සම්පත්, ස්ථානගතවීම්, පෙර පුහුණු ආදිය වැදගත් වේ.

2. මානසික සූදානම - යුද හමුදාවක උපරිම ශක්‍යතාවය ප්‍රදර්ශනය කරනු වස් මානසික සූදානම යන්න සුවිශේෂී දායකත්වයක් දක්වනු ලබයි. ඒ සඳහා සැලසුම් සම්බන්ධයෙන් වන විශ්වසනීයත්වය, විකල්ප සැලසුම් පැවතීම හා ඒවායේ යෝග්‍යතාවය, ජනතා සහය, තම පුහුණුව සම්බන්ධයෙන් වන පරිපූර්ණ හැඟීම, භූමියට සහ අවට පරිසරයට ඇති අනුගතභාවය, පෙර සටන් සම්බන්ධයෙන් පවතින අත්දැකීම්, නායකත්වය පිළිබඳ විශ්වාසය ආදිය අදාළ වේ.

භෞතික සූදානම හා මනාව බද්ධ වූ මානසික සූදානම යුද ජයග්‍රහණය උදෙසා මගපාදන අතර එමගින් සතුරු ප්‍රහාරයක දී අවාසි සහගත තත්වයකට පත් නොවීමටත්, සතුරා වෙත දියත් කරන ප්‍රහාරයක දී වැඩි වාසි අත්පත් කරගැනීමටත් හැකිවේ. එකිනෙක හා බද්ධ වූ සාධකයකයන් ද්විත්වයක් වන භෞතික සූදානම සහ මානසික සූදානම යන්න පහත රූපසටහනින් විග්‍රහ කෙරේ.




9 රූපය - යෝජිත යුද මූලධර්මය 3 - සූදානම

ඉහත විග්‍රහ කරන ලද දේශීය පාරම්පරික යුද ඥානය නියෝජනය කරන්නා වූ යෝජිත යුද මූලධර්මයන් ත්‍රිත්වය ශ්‍රී ලංකාව වෙනුවෙන් යුද හමුදා තාර්කික භාෂිතයක් (Army Doctrine) නිර්මාණය කිරීමේ දී භාවිතය තුළින් විදේශීය යුද සංකල්පයන්ගෙන් විශේෂිත වූ දේශීය අනන්‍යතාවයක් සහිත සංකල්පමයකරණයකට වැදගත් වනු ඇත.

සමස්තයක් වශයෙන් ගෙන විශ්ලේශන කිරීමේ දී දන්තුරේ සටන් ව්‍යාපාරය යන්න දේශීය යුද සෙබළාගේ අනන්‍ය වූ ලක්ෂණයන් බොහොමයක් ඉස්මතු කරන ලද දේශීය යුද ඥානයේ සුවිශේෂීත්වය මනාව ප්‍රදර්ශනය කරන ලද අවස්ථාවක් වශයෙන් හැඳින්විය හැකිය. එසේ ම එමගින් අනාවරණය කරගත හැකි දේශීය අනන්‍යතාවයකින් යුතු යුද මූලධර්මයන් තුළින් පැහැදිලි වන්නේ

ඓතිහාසික යුද්ධයන් හි දී දේශීය පාරම්පරික යුද ඥානය උපක්‍රමික ව භාවිතය තුළින් සාපේක්ෂ ව වැඩි දියුණුවක් අත්පත් කරගෙන සිටි බටහිර ජාතීන් පවා දරුණු ලෙස පරාජය කළ හැකි වූ බවයි.

## ආශ්‍රිත ග්‍රන්ථ සහ ලිපි නාමාවලිය


### ප්‍රාථමික සිංහල මූලාශ්‍ර

*ගරිල්ලා යුධ ක්‍රම.* (2004). චේ ගුවේරා, (එම්.එස්.එස් ඩයස්, පරි.). සංචිත ප්‍රකාශන. පන්නිපිටිය.

*මන්දාරම් පුර පුවත.* (1998). (සංස්.). ලබුගම ලංකානන්ද හිමි. කොළඹ. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

*රාජාවලිය.* (1976). (සංස්). සුරවීර, ඒ. වී. කොළඹ. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

*රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය.* (2002). ජොආඕ රිබෙයිරෝ, (ටී. කේ. රුබේරු, පරි.). කොළඹ. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

### ප්‍රාථමික ඉංග්‍රීසි මූලාශ්‍ර

*Art of War by Sun Tzu.* . (1910 ). Sun Tzu (L.Giles, Trans.). Retrieved from https://suntzusaid.com/artofwar.pdf

*The Arthashastra*.(1992). Kautilya. (L.N Rangarajan, Trans.). New Delhi. Penguine books.

*The Temporal and Spiritual Conquest of Ceylon.*(1930). Fernao De Queyroz. (G.S Perera, Tans.). A.C Richards, Acting Government Print.

*Principles of war*.(2003). Carl Van Clausewitz, (H. W. Gatzke, Trans.). New York. Dover Publications.

### ද්විතීයික සිංහල මූලාශ්‍ර

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. (2016). *ශ්‍රී ලංකාවේ ඉතිහාසය - තුන්වන කොටස.* කොළඹ. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේනතුව.

අබේසිංහ, ටී. (2006). *පෘතුගීසින් හා ලංකාව (1597-1658).* පන්නිපිටිය. ස්ටැෆර්ඩ් ලේක් ප්‍රකාශන.

කොඩ්රිංටන්, එච්. ඩබ්. (1998). *සංක්ෂිප්ත ලංකා ඉතිහාසය.* රාජගිරිය. කුරුළු පොත් ප්‍රකාශකයෝ.

ජයතිලක, එන්. (2013). *කන්ද උඩරට සටන් හා ආරක්ෂක විධිවිධාන :ක්‍රි.ව 1521 - 1658 දක්වා පෘතුගීසීන් සම්බන්ධව.* ජාඇල. සමන්ති පොත් ප්‍රකාශකයෝ.

පවෙල්, ජෙෆ්රි. (2009). *කන්ද උඩරට සටන්.* (පී. අල්විස්, පරි.). කොළඹ. සූරිය ප්‍රකාශකයෝ.

බණ්ඩාරගේ, සී. (2015, ඔක්තෝබර් 28). පරාගියා ලංකාවට ඇවිත් අවුරුදු 510 යි. *දිවයින බදාදා අතිරේකය.*උපුටා ගැනීමhttp://www.divaina.com/2015/10/28/badada01.html.

සෝමතිලක, එම්. (2009). *පෘතුගීසී පාලන සමය සහ ගන්නෝරුව සටන.* කොළඹ. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

### ද්විතීයික ඉංග්‍රීසි මූලාශ්‍ර

*Administration*.(n.d.). Retrieved from http://dictionary.cambridge.org/dictionary/english/administration

Clark, R. (1987). *The essential elements of operational surprise.* Kansas. U S Army command and general staff college.

Doctrine Cell.(2012). *New Zealand Defence Doctrine.* (3rd ed.). Wellington. Headquarters New Zealand Defence Force.

Dominic D.P. and Dominic T. “The Rubicon Theory of War: How the Path to Conflict Reaches the Point of No Return,” *International Security, 36*(1), 7-40.

Erfurth,W. (1983). *Surprise*. USA. Army War College.

Indian Army.(2004*). Indian Army Doctrine.*Shimla.Headquarters Army Training Command.

Khaífiah,D. Situngkir,H. *Social Balance Theory; Revisiting Heider’s Balance theory for Many Agents.* Retrieved from http://xxx.lanl.gov/ftp/nlin/papers/0405/0405041.pdf

Ministry of Defense.(2001). *British Defence doctrine*. (2nd ed.). Swindon.Joint military publication.

Ministry of Defense.(2014). *UK Defense doctrine*. (5th ed). Bicester.Publication Section of Headquarters and Operations Centre.

Muththukumaru, A. (1987). *The military History of Ceylon – an outline*. New Delhi. Navrang.

Phillips, W. (1983).*Flexibility: an essesial in military operations*. Retrieved from http://www.au.af.mil/au/afri/aspj/airchronicles/aureview/1983/jul-aug/phillips.html

Scammell. G. V. (1989). *The First Imperial Age: European Overseas Expansion C. 1400-1715*. New Delhi. Routledge.

Sri Lanka Military Academy.(2012). *Training Tactics*.Diyathalawa. Publication Section

Sri Lanka Military Academy.(2015*). Battle of Danture; A Turning Point in the Sri Lankan History.*Diyathalawa.Publication Section.

The Horton Academy.(2016). *Staff Officer’s Handbook – Operations and Tactics.* Freetown. The Horton Academy.

*The military revolution: Tactical Flexibility*. (n.d.). Retrieved from http://www.au.af.mil/au/awc/awcgate/gabrmetz/gabr000c.html

Whaley, B. (1969).*Stratergem: Deception & Surprise in war*. Cambridge. Massachusetts Institute of Technology.